(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 9(6).]

# පාර්ලිමේන්තුවේ අංක 9 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2013 ඔක්තෝබර් මස 25 වැනි සිකුරාදා**

## 2013 නොවැම්බර් මස 05 වැනි අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

විසර්ජන පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

ධීවර හා ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනි වර කියවීම.

***** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

## 2013 නොවැම්බර් මස 29 වැනි සිකුරාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2507/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පිහිටා තිබෙන ඇතාවැටුනවැව විද්‍යාලයේ භෞතික සම්පත් සහ මානව සම්පත් ඌනතාවයන් රැසක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඇතාවැටුනවැව විද්‍යාලයේ පවතින භෞතික සම්පත් හා මානව සම්පත් ඌනතාවයන් කවරේද

(ii) එම අඩුපාඩුකම් සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2937/'12

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 සහ 2012 වර්ෂවලදී පවත්වන ලද ජන සංගණනය සඳහා දරන ලද සමස්ත වියදම කොපමණද;

(ii) ඉහත සංගණනයේදී තොරතුරු ලබාගැනීම සඳහා සේවයෙහි යොදවන ලද පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(iii) සිංහල, දෙමළ, මුස්ලිම්, මැලේ, බර්ගර් සහ වෙනත් යනාදී වශයෙන් ජනවාර්ගික කණ්ඩායම් පදනමින් රටෙහි ජනගහනය කොපමණද;

(iv) බෞද්ධ, ක්‍රිස්තියානි (සෑම නිකායක්ම), හින්දු, ඉස්ලාම් වශයෙන් ආගමික පදනමින් රටෙහි ජනගහනය කොපමණද;

(v) එක් එක් දිස්ත්‍රික්කයෙහි ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ජනගහන සහ නිවාස සංගණනයෙහි දත්ත සුපිරික්සීම (data scanning) පිණිස වන ප්‍රසම්පාදනය සම්බන්ධයෙන්;

(i) ප්‍රසම්පාදනය ලැබූ ලංසුකරු කවරහුද;

(ii) එක් එක් ප්‍රසම්පාදනය සඳහා ඉදිරිපත් කල මිල ගණන් වෙන් වෙන්ව දක්වමින්, එම ප්‍රසම්පාදනය සඳහා මිල ගණන් ඉදිරිපත් කළ අනෙකුත් ලංසුකරුවන්ගේ නම් කවරේද;

(iii) අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන මණ්ඩලයේ සාමාජිකයින්ගේ නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2989/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පානම, ශාස්ත්‍රවෙල ප්‍රදේශයේ වනාන්තර හා කෘෂිකාර්මික බිම් අක්කර 1220 ක ප්‍රමාණයක් නාවික හමුදාව හා විශේෂ කාර්ය බලකාය විසින් අත්පත්කර ගෙන තිබෙන බවත්;

(ii) එම භූමියේ රණවිරු ගම්මානයක්, නාවික හමුදා කඳවුරක් හා හෝටල් සංකීර්ණයක් ඉදිකිරීමට සැලසුම්කර ඇති බවත්;

(iii) එම භූමියෙහි පිහිටා ඇති බැලුම්කාරාරාම විහාරය ඇතුළු තවත් පුරාවිද්‍යාත්මක ස්ථානවලට ඇතුළුවීම ජනතාවට තහනම්කර ඇති බවත්;

(iv) එකී ඉඩම් අත්පත් කර ගැනීම නිසා ප්‍රදේශයේ ජන ජීවිතයට සහ ස්වාභාවික පරිසරයට දැඩි බලපෑමක් එල්ලවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ඉඩම් අත්පත්කර ගැනීම සඳහා නීත්‍යානුකූල අවසරයක් ලබාගෙන තිබේද;

(ii) එම ඉඩම් අත්පත්කර ගැනීම නිසා ඉඩම් හා දේපළ අහිමි වන ජනතාවට නැවත ඉඩම් හෝ වන්දි ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3061/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) කලුතර දිස්ත්‍රික්කයේ, හොරණ, මතුගම සහ කලුතර යන අධ්‍යාපන කලාපවලට අයත් පාසල් රැසක ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු මුදල් නොමැතිකමින් නතර කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අධ්‍යාපන කලාප තුළ ඇති අඩක් නිමකරන ලද ගොඩනැගිලි සහිත පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රජය විසින් වෙන්කරන ලද මුදල්වලට සිදුවූයේ කුමක්ද;

(iii) එම පාසල්වල පවතින අඩක් නිමකළ ගොඩනැගිලිවල ඉදිකිරීම් සම්පූර්ණ කිරීම සඳහා තවදුරටත් අවශ්‍යවන මුදල කොපමණද;

(iv) අදාළ මුදල් ප්‍රතිපාදන කඩිනමින් වෙන්කොට එම පාසල් ගොඩනැගිලිවල ඉදිකිරීම් සම්පූර්ණ කරදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3342/'12

ගරු පී. හැරිසන් මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2006 වර්ෂයේදී මාවිල්ආරු වගා හානි වෙනුවෙන් ගොවි විශ්‍රාම වැටුපෙන් මුදල් ගෙවීම් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම ගෙවීම් කරනු ලැබූ ගොවීන් සංඛ්‍යාව, එක් ගොවි මහතෙකුට ගෙවන ලද මුදල සහ ඒ සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(iii) එම මුදල් ගෙවීමේදී වංචා සිදුවී තිබේද;

(iv) එසේ නම්, එම වංචා සිදුකළ අයට දඬුවම් ලබාදී තිබේද;

(v) ලබා දුන් එම දඬුවම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3254/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මෑතකදී ලැප්ටොප් පරිගණක ලබාදුන් ජනමාධ්‍යවේදීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ජනමාධ්‍යවේදීන්ගේ නම් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(iii) එම ලැප්ටොප් පරිගණක ලබාදීමට ජනමාධ්‍යවේදීන් තෝරා ගන්නා පදනම කවරේද;

(iv) එම එක් පරිගණකයක මිල කොපමණද;

(v) මේ දක්වා බෙදා දී ඇති ලැප්ටොප් පරිගණක සඳහා වැයකර ඇති සමස්ත මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3351/'12

ගරු පී. හැරිසන් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවලට කුලී පදනම මත ලබාගෙන ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබාගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමඟ අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 02 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2613/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහමඩගල්ල වැව නමින් යෝජිත වාරි ව්‍යාපෘතියක් ඇති බව දන්නේද;

(ii) එම වාරි ව්‍යාපෘතිය සඳහා මුල් ගල් තැබූ දිනය කවරේද;

(iii) අද වනතෙක් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීමට හේතු කවරේද;

(iv) ඉදිරියේදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3146/'12

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 ජනවාරි මස 01 වැනිදා සිට අද දක්වා ඉන්දියාවෙන් ශ්‍රී ලංකාවට ලැබුණු ආධාර, සහනදායී ණය සහ ප්‍රදාන ප්‍රමාණයන් වාර්ෂික පදනමින්, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මුදල් ලබාදී තිබූ වර්ෂයක් සඳහා සියල්ල ඇතුළත් වැඩිම සහ අඩුම පොලී පිරිවැය කවරේද;

(iii) එක් එක් මුදල් ලබාදීම සඳහා ආපසු ගෙවීමේ කාල සීමාව කවරේද;

(iv) එකී මුදල් උපයෝගී කරගනු ලැබූ එක් එක් ව්‍යාපෘතියෙන් උපයා ගැනීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණය කවරේද;

(v) ණය මුදල ලබා දී තිබූ දිනයේ සිට වර්ෂ 5ක් සඳහා එක් එක් ණය මුදලේ මුදල් ප්‍රවාහ ප්‍රකාශ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3378/'12

ගරු පී. හැරිසන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු මැද පළාත තුළ වත්මන් පාසල් ළමුන් සංඛ්‍යාව සහ පාසල් සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උතුරු මැද පළාතේ පාසල් අධ්‍යාපන කටයුතු සඳහා එම පළාත් සභාව මගින් පසුගිය වර්ෂ පහක කාලය තුළදී වෙන් කරන ලද මුදල කොපමණද;

(iii) ඒ අනුව පසුගිය වර්ෂ පහ තුළ එම පළාතේ එක් පාසල් දරුවෙකු වෙනුවෙන් වාර්ෂිකව වැය කරන ලද මුදල කොපමණද;

(iv) පසුගිය වර්ෂ පහ තුළ එක් ළමයෙකු වෙනුවෙන් වැය කරන ලද සමස්ත මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අනුරාධපුර හා පොළොන්නරු දිස්ත්‍රික්කවල නව පාසල් ගොඩනැගිලි ඉදිකිරීම හා පවතින ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම සඳහා පසුගිය වර්ෂ පහ තුළ වෙන් කරනු ලැබූ මුදල කොපමණද;

(ii) එම ඉදිකරන ලද හා අලුත්වැඩියා කරන ලද පාසල්වල නාම ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(iii) එම ඉදිකරන ලද හා අලුත්වැඩියා කරන ලද පාසල්වල 2012 වර්ෂය අවසාන වනවිට අධ්‍යාපනය ලැබූ ළමුන් සංඛ්‍යාව එක් එක් පාසල අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3398/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර මහ නගර සභාව මගින් තම බලප්‍රදේශය අලංකාර කිරීම සඳහා කටයුතු කරමින් සිටියද නගරයේ ප්‍රධාන පෙළේ රජයේ පාසල් හා රාජ්‍ය ආයතන පිහිටි ප්‍රදේශවල සහ අනෙකුත් ප්‍රදේශවල පිහිටි අතුරු මාර්ග වසර 20 කින් පමණ ප්‍රතිසංස්කරණය නොකිරීම නිසා දැඩි ලෙස අබලන් වී ඇති බවත්;

(ii) අතුරු මාර්ග දෙපස තැනින් තැන කැළිකසළ දැමීම නිසා මහජනතාවගේ සෞඛ්‍යයට තර්ජනයක් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මාතර මහ නගර සීමාව තුළ අබලන් මාර්ග කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) කැළි කසළ බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3622/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම, මුල්ලිකුලම් ගම්මානයේ සිටි වැසියන් එම ගම තුළම නැවත පදිංචි කිරීමට පියවර ගෙන තිබේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මුල්ලිකුලම් ගම්මානයේ හමුදා කඳවුරු ඉදිකර තිබේද;

(ii) මේ වන විට මුල්ලිකුලම් වනාන්තරය තුළ අවතැන්වූවන් ලෙස රැඳී සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4079/'13

ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම හා මුලතිව් දිස්ත්‍රික්කයන්හි ධීවරයන්හට ලබාදෙන සම්පූර්ණ මුද්දර සහනාධාරය කොපමණද;

(ii) මෙම සහනාධාරය අඩු කරනු ලැබීමට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2614/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හක්වටුනාව නමින් වාරි ව්‍යාපෘතියක් තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) හක්වටුනාව වාරි ව්‍යාපෘතිය යටතේ,

(i) අස්වද්දන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ප්‍රතිලාභ ලබන ගොවි පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) යල මහ දෙකන්නයේම වගා කටයුතු සඳහා ජලය ලබා ගැනීමට හැකියාව තිබේද;

(iv) එම හැකියාව නොමැති නම්, එසේ කිරීමට හැකිවන පරිදි හක්වටුනාව වාරි ව්‍යාපෘතිය වැඩි දියුණු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3147/'12

ගරු රවී කරුණානායක මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂය සඳහා ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ ශුද්ධ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2010, 2011 සහ 2012 වර්ෂ සඳහා ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ මගී සේවා පහසුකම් සැපයීම, තීරුබදු රහිත භාණ්ඩ විකිණීමේ කටයුතු, බස් රථ සේවාව, මගී ගුවන්ගතවීම් සහ භාණ්ඩ තොග වැනි ක්ෂේත්‍ර හසුරුවනු ලබන එක් එක් උප සමාගමේ ඉපයීම් කවරේද;

(iii) ගුවන්යානයක් සඳහා දරන වාර්ෂික පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සමස්ත කාර්ය මණ්ඩල වැටුප් සහ ආදායම;

(ii) මගී ගුවන් යානයක ඇති ආසන සංඛ්‍යාව සහ එහි ගමන් කරන සැබෑ මගීන් සංඛ්‍යාව;

(iii) භාණ්ඩ තොගවලින් ලැබෙන ආදායම සහ සමස්ත ආදායම;

(iv) ප්‍රාග්ධන ක්‍රමක්ෂයට ආදායම සහ ශුද්ධ ලාභය;

අතර පවතින ප්‍රධාන අනුපාතයන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ශ්‍රී ලන්කන් ගුවන්සේවය, එමිරේට්ස් ගුවන් සේවයෙන් යළි පවරාගත් දින සිට මේ දක්වා ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ ප්‍රාග්ධන සහ පොදු සංචිත ප්‍රමාණ වාර්ෂික පදනමින් කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 03 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2266/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කොටවිල, කඹුරුගමුව ලිපිනයේ පදිංචි කේ.කේ. ඇඩ්වින් මහතා,

(i) ලංකා ගමනාගමන මණ්ඩලයේ (ලංගම) ස්ථිර පුහුණු රියදුරෙකු ලෙස වර්ෂ 1965 සිට 1986 දක්වා සේවය කර ඇති බවත්;

(ii) විශ්‍රාම යෑමෙන් පසුවද වර්ෂ 1986 සිට 1994 දක්වා කොන්ත්‍රාත් පදනම මත රියදුරෙකු ලෙස නැවත සේවයේ යොදවා තිබූ බවත්;

(iii) මේ වනතෙක් ඔහුගේ සේවා කාලය අනුව ඔහුට හිමි අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, පාරිතෝෂික මුදල් හා වෙනත් කිසිම ගෙවීමක් කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ලංකා ගමනාගමන මණ්ඩලය මගින් ඇඩ්වින් මහතාට ගෙවිය යුතු අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, පාරිතෝෂික මුදල් හා අනෙකුත් ගෙවීම්වල වටිනාකම කොපමණද;

(ii) එම මුදල ශාරීරික වශයෙන් දුර්වලව සිටින ඇඩ්වින් මහතාට ගෙවීමට සහ වර්ෂ විස්සකට අධික කාලයක් ලංගමයෙහි රඳවාගත් එම මුදල වෙනුවෙන් පොලී මුදලක් ගෙවීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2647/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන්වන පරිදි දිවයිනේ විවිධ ප්‍රදේශවල සිටින ඉඩම් නොමැති රජයේ සහ සංස්ථා සේවකයින්ට නිවාස ඉදිකර ගැනීම සඳහා පර්චස් 10කට නොඅඩු ඉඩම් කැබලි 25,000ක් බෙදා දී තිබේද;

(ii) එසේ නම්, මේ වන විට එලෙස ඉඩම් ලබා දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3148/'12

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009, 2010, 2011, 2012 යන වර්ෂවලදී සහ 2013 වර්ෂයේ මේ දක්වා ලබාගෙන ඇති ශුද්ධ ණය ප්‍රමාණයන් කවරේද;

(ii) ශුද්ධ සංචිත විශාල වශයෙන් වැඩිවෙමින් පවතින බවට රජය විසින් සිදු කරනු ලබන ප්‍රකාශයට අනුව ඉහත කී වර්ෂ තුළදී සංචිත වැඩි වී ඇති ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ දක්වා සංචිතවලට ඇතුළත් කරන ලද දිගු කාලීන ණය ප්‍රමාණය කොපමණද;

(ii) පසුගිය වර්ෂ තුන තුළ එක් එක් වර්ෂයේදී ආනයනයේ ප්‍රතිශතයක් වශයෙන් සංචිත ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) සංචිතවල තත්ත්වය ප්‍රකාශ කරනු ලබන තරමට ධනාත්මක නොවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3380/'12

ගරු පී. හැරිසන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු මැද පළාතේ, එක් එක් දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට අපේක්ෂිත සපිරි පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉදිකිරීමට අපේක්ෂිත ඉහත පාසල් සංඛ්‍යාව එම පළාතේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උතුරු මැද පළාත තුළ ස්ථාපනය කිරීමට අපේක්ෂිත සපිරි පාසල් අතරින් 2012 දෙසැම්බර් වනවිට වැඩ අවසන් කර තිබූ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) උතුරු මැද පළාතේ වැඩ අවසන් නොකළ සපිරි පාසල් තිබේ නම්, ඒවායේ ඉදිකිරීම් සම්පූර්ණ කරන දින වකවානු කවරේද;

(iii) සපිරි පාසල්වල ඇති කිරීමට බලාපොරොත්තු වන පහසුකම් කවරේද;

(iv) 2012 වර්ෂය අවසාන වනවිට රට තුළ වැඩ අවසන් කර තිබූ සමස්ත සපිරි පාසල් සංඛ්‍යාව කොපමණද;

(v) එම පාසල්වල නාම ලේඛනයක් ඒවා පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) සපිරි පාසලකට සිටිය යුතු අවම ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුරුවරුන් සංඛ්‍යාව ශ්‍රේණිධාරී, උපාධිධාරී හා වෙනත් සුදුසුකම් යන වර්ගීකරණයන් යටතේ වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3623/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බස්නාහිර පළාතේ, ගොඩගම නගරය සංවර්ධනය කිරීම සඳහා නගර සංවර්ධන සැලැස්මක් සකස් කර තිබේද;

(ii) එම නගර සංවර්ධන සැලැස්ම අනුමත වී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ගොඩගම නගරය සංවර්ධනය කිරීම උදෙසා පවරාගත් භූමි භාගයක් තිබේද;

(ii) එසේ නම්, එම භූමිය පිහිටි ස්ථානය කවරේද;

(iii) නාගරික සංවර්ධන අධිකාරිය මගින් ගොඩගම නගරයේ ඉඩම් ගොඩකර විකුණා තිබේද;

(iv) එසේ නම්, එම ඉඩම්වල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2648/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වන පරිදි සියලුම රජයේ සේවකයින්ගේ පහසුව සඳහා නවීන සෞඛ්‍ය පහසුකම්වලින් සමන්විත ''සේවක ආරෝග්‍ය ශාලාවක්'' මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටුවා තිබේද;

(ii) එසේ නම්, එම ''සේවක ආරෝග්‍ය ශාලාවේ'' කටයුතු ආරම්භ කළ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3149/'12

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010, 2011 සහ 2012 වර්ෂවල රජය විසින් ලබාගත් ණය මුදල් හා ඒවායේ ආපසු ගෙවීමේ කාලසීමාවන් වාර්ෂික පදනමින් කවරේද;

(ii) ආදායම් උත්පාදනය කර ණය ආපසු ගෙවන ආකාරය ඇතුළුව මුදල් ප්‍රවාහ ප්‍රකාශ කවරේද;

(iii) පැරණි ණය ගෙවීම සඳහා රජය තව තවත් ණය ගැනීම සිදු කරන්නේද;

(iv) ඉහත (i) හි දක්වා ඇති කාල සීමාවන්හිදී ලබාගෙන ඇති ණය සඳහා පිරිවැය ඉක්මවා ලැබූ ආදායමේ වර්ධනය කොපමණද;

(v) රට ණය උගුලක් කරා ගමන් කරමින් සිටින්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2009 වර්ෂයේ සිට මේ දක්වා රජය ණය, රජයේ බැඳුම්කර යනාදිය හරහා ඇ.එ.ජ ඩොලර් මිලියන 500 ඉක්මවා ණයට ගෙන ඇති අවස්ථා ද එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3422/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, හක්මන ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පිහිටි, ඇල්ලවෙල වැවෙහි ප්‍රතිසංස්කරණ කටයුතු පසුගිය දිනවලදී සිදුකළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය කොපමණද;

(ii) එම මුදල් සපයාගනු ලැබූ මූලාශ්‍ර කවරේද;

(iii) ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීමට ටෙන්ඩර් කැඳවීමක් සිදුකරනු ලැබුවේද;

(iv) එසේ නම්, ඒ සඳහා ඉදිරිපත් වූ එක් එක් ටෙන්ඩර් අයදුම්කරුගේ නම, ලිපිනය සහ ඉදිරිපත් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) මේ වනවිට වැවෙහි ප්‍රතිසංස්කරණ කටයුතු කරනු ලබන කොන්ත්‍රාත්කරුගේ නම, ලිපිනය සහ ඔහු විසින් ඉදිරිපත් කළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 04 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2651/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වන පරිදි මල්වතු ඔය සහ යාන් ඔය අතර උතුරු තැනිතලාවේ ගංගා හා ඇළ මාර්ග ආශ්‍රිතව දේශීය තාක්ෂණය සහ ශ්‍රමය භාවිතා කරමින් වාරිමාර්ග කටයුතු සඳහා නව ජලාශ 30ක් ඉදිකිරීම අරඹා තිබේද;

(ii) එසේ නම්, එම නව ජලාශ ඉදිකිරීමේ කටයුතු ආරම්භ කළ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3150/'12

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 ජනවාරි 1 වැනි දින සිට අද දක්වා ශ්‍රී ලංකාවට චීනයෙන් ලැබී ඇති ආධාර, සහනදායී ණය හා ප්‍රදාන ප්‍රමාණයන් වාර්ෂික පදනමින් කොපමණද;

(ii) එකී අරමුදල් ලබා දුන්, සියල්ල ඇතුළත් වැඩිම සහ අඩුම පොලී පිරිවැය වසරක් සඳහා කොපමණද;

(iii) එක් එක් අරමුදල් සැපයුමේ ආපසු ගෙවීමේ කාල සීමාව කවරේද;

(iv) අරමුදල් යොදාගත් එක් එක් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ආදායම් කවරේද;

(v) ණය ලබාදුන් දිනයේ සිට වසර 5ක් සඳහා එක් එක් ණයෙහි මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3364/'12

ගරු පී. හැරිසන් මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ලංකා පොස්පේට් සමාගම විසින් 2010, 2011 සහ 2012 වර්ෂවලදී නිපදවූ එප්පාවල රොක් පොස්පේට් පොහොර ප්‍රමාණය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පොස්පේට් සමාගම සතු පොහොර නිෂ්පාදන යන්ත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) පොස්පේට් සඳහා වන දේශීය වාර්ෂික අවශ්‍යතාව මෙට්‍රික් ටොන් කොපමණද;

(iv) පොස්පේට් සමාගමේ වාර්ෂික නිෂ්පාදනවල අතිරික්තයක් තිබේද;

(v) එසේ නම්, එම අතිරික්තය මෙට්‍රික් ටොන් කොපමණද;

(vi) දේශීය අවශ්‍යතාව සපුරාලීමට ප්‍රමාණවත් නිෂ්පාදන හැකියාවක් තිබියදීත්, එම සමාගමට අලුතින් පොහොර සැකසුම් යන්ත්‍රයක් මිලදී ගැනීමේ අවශ්‍යතාවයක් ඇතිවීමට හේතුව කුමක්ද;

(vii) එම නව යන්ත්‍රය මිලදී ගැනීමේදී ටෙන්ඩර් පටිපාටි අනුගමනය කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් යන්ත්‍රය,

(i) ඇණවුම් කළ ක්‍රමවේදය කවරේද;

(ii) මිලදී ගැනීමට වැය කළ මුදල කොපමණද;

(iii) ඇණවුම් කිරීම සඳහා නිලධාරීන් චීනයට යනවිටත් එම යන්ත්‍රය ශ්‍රී ලංකාවේ වරායට ගෙන්වා තිබූ බව දන්නේද;

(iv) මේ වනවිට එම යන්ත්‍රය මගින් නිෂ්පාදනය කරනු ලබන පොහොර මෙට්‍රික් ටොන් ප්‍රමාණය කොපමණද;

(v) එම යන්ත්‍රය සවිකළ ගොඩනැගිල්ල ඉදිකිරීමට වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3419/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පසුගිය වර්ෂ 10ක කාලසීමාව තුළ ලියාපදිංචි වී ඇති ත්‍රිරෝද රථ හා යතුරුපැදි සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ත්‍රිරෝද රථ සහ යතුරුපැදි සඳහා රජය ලබාදී ඇති සහන කවරේද;

(iii) ත්‍රිරෝද රථ සහ යතුරුපැදි ආශ්‍රිත කර්මාන්තවල යෙදෙන අය දිරිමත් කිරීම සඳහා එම රථවල අමතර කොටස් සඳහා බදු සහන ලබාදීමට කටයුතු කරන්නේද;

(iv) දැනටමත් එලෙස සහන ලබාදී ඇත්නම්, ඒවායේ ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3624/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව මගින් හල්දුම්මුල්ල, බෝගහපිටිය, සොරගුණේ වනාන්තරය ආශ්‍රිතව එළිපෙහෙළි කරමින් මාර්ගයක් ඉදිකරන බවත්;

(ii) ඊට අදාළව සිදුවන වනාන්තර විනාශය පිළිබඳව වේලි ඔය ගොවි සංවිධානය සහ භික්ෂු සංවිධානය මගින් ජනාධිපතිතුමාට ලිඛිතව දන්වා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් මාර්ගය ඉදිකිරීමේ අරමුණ කවරේද;

(ii) එම මාර්ගය ඉදිකිරීම සඳහා පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ අනුමතිය ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2652/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වන පරිදි ප්‍රධාන නගර 25ක තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවා තිබේද;

(ii) එසේ නම්, පිහිටුවා ඇති එම තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන සංඛ්‍යාව එක් එක් ප්‍රධාන නගරය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3151/'12

ගරු රවී කරුණානායක මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ නාවික කර්මාන්තයට තර්ජනයක් වන ආකාරයට වරාය මෙහෙයුම් සිදු කරන රටවල් පහ කවරේද;

(ii) ඉහත සඳහන් රටවල ඇති එක් එක් වරායෙන් එල්ල වී තිබෙන තර්ජන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එවන් තර්ජනයන්ට එරෙහිව කටයුතු කිරීමට ශ්‍රී ලංකාව අපේක්ෂා කරන ආකාරය සහ එමගින් දේශීය නාවික කර්මාන්තයට ප්‍රතිලාභයක් අත්කර දෙන ආකාරය කවරේද;

(iv) 2010, 2011 සහ 2012 වර්ෂවලට අදාළව, එක් එක් වර්ෂයේදී ඉහත (ii) හි සඳහන් තර්ජනයන් එල්ල වී ඇති වරායවල බහාලුම් මෙහෙයුම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉදිරි වර්ෂ 5 සඳහා ඉහත සඳහන් වරායවල මෙහෙයුම් පිළිබඳ ප්‍රක්ෂේපණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව බහාලුම් මෙහෙයුම් ආකර්ෂණය කරගැනීමට බලාපොරොත්තු වන්නේ කුමන වරායවලින්ද;

(ii) ඉහත සඳහන් එක් එක් වරායෙන් ලබා ගැනීමට බලාපොරොත්තුවන බහාලුම් මෙහෙයුම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකා වරාය අධිකාරිය ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉහත සඳහන් බහාලුම් මෙහෙයුම් මුළු සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3420/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, හක්මන ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පිහිටි, දෙනගම වැවෙහි ජල කාන්දුවක් පැවති බවත්;

(ii) එම වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා දැනට කටයුතු සිදුවෙමින් පවතින බවත්;

(iii) වැවෙහි ප්‍රතිසංස්කරණ කටයුතු නිසි ප්‍රමිතියකින් සිදුනොකරන බවට ප්‍රදේශවාසීන් චෝදනා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ඇස්තමේන්තුගත මුළු මුදල කොපමණද;

(ii) එම මුදල් සපයාගනු ලබන මූලාශ්‍ර කවරේද;

(iii) ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමට ටෙන්ඩර් කැඳවීමක් සිදුකරනු ලැබුවේද;

(iv) එසේ නම්, ඒ සඳහා ඉදිරිපත් වූ එක් එක් අයදුම්කරුගේ නම, ලිපිනය සහ ඉදිරිපත් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) දැනට වැවෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකරනු ලබන කොන්ත්‍රාත්කරුගේ නම, ලිපිනය සහ ඔහු විසින් ඉදිරිපත් කළ ටෙන්ඩර් මුදල කවරේද;

(vi) එම කොන්ත්‍රාත්කරු සිදුකරනු ලබන ප්‍රතිසංස්කරණ ප්‍රමිතියෙන් තොර බවට නැගෙන චෝදනා පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 05 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2208/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) සංවර්ධන ලොතරැයි මණ්ඩලයට අදාළව, පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) යෙදවූ මුළු ප්‍රාග්ධනය හා සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(iii) කාර්ය මණ්ඩලයේ මුළු සේවක සංඛ්‍යාව, එක් සේවකයෙකු වෙනුවෙන් දැරූ පිරිවැය සහ එක් සේවකයෙකුගෙන් ලැබූ ලාභය කවරේද;

(iv) රජය වෙත ගෙවන ලද අඩු කිරීම් හෝ බදු ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ පහක කාලය තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කවර හෝ මුදලක් කපාහරිනු ලැබුවේද;

(ii) එසේ නම්, එසේ කපා හරින ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එසේ කරන ලද්දේ කවර හේතුවක් නිසාද;

(iv) එය සිදු කළ දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පසුගිය වර්ෂ පහක කාලය තුළ එම මුදල් භාවිතා කරන ලද ආකාරයට වඩා කාර්යක්ෂම ලෙස සංවර්ධන ලොතරැයි මණ්ඩලයට එම මුදල් පරිහරණය කළ හැකිව තිබුණේද;

(ii) එසේ නම්, එය කළ හැකි ආකාරය කවරේද;

(iii) එසේ කළ නොහැකි නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2224/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩපිළිවෙළ යටතේ, කුරුණෑගල, අනුරාධපුර, මහනුවර යන දිස්ත්‍රික්කවල විදේශ රැකියාවල යෙදෙන්නන් වෙනුවෙන්ම නිවාස 15000කින් සමන්විත නව නිවාස යෝජනාක්‍රම තුනක් ආරම්භකරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් නිවාස ව්‍යාපෘති ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ වනවිට ඉදිකිරීම් අවසන් කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇති නගර කවරේද;

(iv) ඉදිකිරීම් අවසන් ව්‍යාපෘතිවල පදිංචිකර ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2439/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, නිල්වලා නිම්නය දෙපස පිහිටා ඇති කිරල කැලේ ප්‍රදේශයේ කුඹුරු විශාල ප්‍රමාණයක් පුරන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ඉඩම් වී වගා කිරීමට හෝ වෙනත් බෝග වර්ග වගා කිරීම සඳහා සුදුසු පරිදි සකස් කිරීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, එම සැලසුම කවරේද;

(iii) මේ වන විට එම බිම් අස්වැද්දීමට අදාළ කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එසේ නම්, වෙන්කර ඇති මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3365/'12

ගරු පී. හැරිසන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු මැද පළාතේ රජයේ පාසල්වල මේ වනවිට සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) උගන්වන විෂයය අනුව එම ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) උක්ත පළාතේ පාසල්වල විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි හා සංගීතය යන විෂයයන්ට හා ප්‍රාථමික අංශයේ ඉගැන්වීම් සඳහා පවතින ගුරු හිඟය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පාසල්වල ගුරු අතිරික්තයක් පවතින විෂයයන් හා එම එක් එක් විෂයයට අදාළව පවතින අතිරික්තය කවරේද;

(v) එම අතිරික්ත ගුරුවරුන් බඳවාගත් පදනම කවරේද;

(vi) අතිරික්ත ගුරුවරුන් අතර සිටින උපාධිධාරීන් සංඛ්‍යාව හා ස්වේච්ඡා පදනම යටතේ බඳවා ගත් ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උතුරු මැද පළාතේ අත්‍යාවශ්‍ය විෂයයන් සඳහා පවතින ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(ii) එමගින් පළාතේ ගුරු අවශ්‍යතාව සපුරාදෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3628/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇඹිලිපිටියේ කඩදාසි කම්හල මුද්‍රා තැබීමට හේතුව කවරේද;

(ii) එම කම්හල මුද්‍රා තැබූ ආයතනය කුමක්ද;

(iii) 2011 නොවැම්බර් 15 වැනි දින සිට 2012 වර්ෂය අවසානය දක්වා එම කඩදාසි කම්හලේ නිෂ්පාදන ධාරිතාවය සහ ආදායම් තත්ත්වය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඇඹිලිපිටිය කඩදාසි කම්හල සතුව පැවති යන්ත්‍රසූත්‍ර යකඩවලට විකුණා ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2653/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වන පරිදි කාන්තාවන් සඳහා වූ විශේෂ කාර්යාලයීය බස් රථ සේවාවක් ආරම්භ කර තිබේද;

(ii) එවැනි බස් රථ සේවාවක් ආරම්භ කර තිබේ නම්, ඊට අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2702/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පිරිවෙන්වල අධ්‍යාපනය ලබන භික්ෂූන්වහන්සේලා දැඩි ආර්ථික අපහසුතා මධ්‍යයේ සිය අධ්‍යාපන කටයුතු කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට පිරිවෙන්වල අධ්‍යාපනය ලබන ගිහි හෝ පැවිදි එක් ශිෂ්‍යයෙකු සඳහා වාර්ෂිකව ලබාදෙන ආධාර මුදල කොපමණද;

(ii) එම මුදල වර්තමාන ආර්ථික තත්ත්වය හා සැසඳීමේදී ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(iii) එම මුදල වැඩි කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, වැඩිකරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2787/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) සරත් ෆොන්සේකා මහතා නිදහස් කරන ලද දිනය කවදාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සමාව දීම කොන්දේසි සහිත සමාව දීමක්ද; නැතහොත් කොන්දේසි විරහිත සමාව දීමක්ද යන්නත්;

(ii) ෆොන්සේකා මහතාගේ විශ්‍රාමික අයිතිවාසිකම් සහ හමුදා නිලය නැවත ලබා දෙන ලද්දේද යන්නත්;

(iii) තවමත් එතුමාව "ජෙනරාල්" යන පදවි නාමයෙන් හැඳින්විය හැකිද යන්නත්;

(iv) ෆොන්සේකා මහතාට එරෙහිව උසාවියේ තවත් පොරොත්තු නඩු තිබේද යන්නත්;

(v) ජනාධිපති සමාව නිසා විභාගවීමට නියමිත එම නඩු අහෝසි වන්නේද යන්නත්;

එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සරත් ෆොන්සේකා මහතා සමග කටයුතු කිරීම හෝ එතුමාට සහාය දීම නිසා පීඩාවට හෙළන ලද හෝ සේවය අවසන් කිරීමට ලක්වූ පොලිසියේ හෝ හමුදාවේ හටයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිලධාරීන් නැවත සේවයේ පිහිටුවීම හෝ වන්දි ලබාදීම සිදුකර තිබේද;

(iii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) සරත් ෆොන්සේකා මහතා නිදහස් කිරීමේ කරුණට අදාළව,

(i) ඒ පිළිබඳව සාකච්ඡා පැවැත්වූ පුද්ගලයින් කවුරුන්ද යන්නත්;

(ii) ඒ සම්බන්ධයෙන් බලපෑම් ඇති කළ රටවල් සහ එය සිදුවූයේ කවර අවස්ථාවක ද යන්නත්;

(iii) දේශපාලන සහ ආගමික නායකයින්ගේ මැදිහත් වීම් නොසලකා හැරියේ කවුරුන්ද යන්නත්;

එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 06 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2654/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වන පරිදි ජන සභා ක්‍රමය ව්‍යවස්ථාපිත කර තිබේද;

(ii) එසේ නම්, එම ජන සභා ක්‍රමය ව්‍යවස්ථාපිත කළ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3197/'12

ගරු රවී කරුණානායක මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011, 2012 වර්ෂවල සහ 2013 වර්ෂයේ මේ දක්වා කාලය තුළ අපනයනය කළ මාළු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකාවෙන් මාළු ආනයනය කරන රටවල් කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ මාළු අපනයනය කරන විශාලතම සමාගම් 5 කවරේද;

(iv) ශ්‍රී ලංකා රජයට එම සමාගම්වලින් ගෙවන බදු මුදල් ප්‍රමාණය කොපමණද;

(v) එම සමාගම්වල සේවයේ නියුතු සේවක සංඛ්‍යාව කොපමණද;

(vi) මාළු අපනයනය කිරීම තවත් රටවල් දක්වා ව්‍යාප්ත කළ හැකිද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ධීවරයන් සඳහා පුහුණු පාසලක් තිබේද;

(ii) නොඑසේ නම්, එවන් පුහුණු පාසලක් පිහිටුවීමට නොහැකි වන්නේ මන්ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3367/'12

ගරු පී. හැරිසන් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ ලියාපදිංචි ආරක්ෂක රැකවරණ ලබන ළමා නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ සිටින ළමුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් ළමයෙකුගේ නඩත්තු කටයුතු වෙනුවෙන් 2013 වර්ෂය සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ ඇති ළමා රැඳවුම් නිවාස සංඛ්‍යාව කොපමණද:

(ii) ඒවායේ සිටින ළමුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් ළමයෙකු වෙනුවෙන් වෙන්කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම මුදල ඔවුන්ගේ නඩත්තු කටයුතු සඳහා ප්‍රමාණවත්වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ ) නොඑසේ නම්, ඒ මන්ද?

3421/’13

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඍජු හා වක්‍ර නව රැකියා විශාල ප්‍රමාණයක් බිහිකරමින් සීඝ්‍ර වර්ධනයක් ලබන මෝටර් රථ කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ න්‍යායාත්මක පුහුණුවක් විද්‍යුත් මාධ්‍ය තුළින් ලබාදිය හැකි බවත්;

(ii) එම අංශයේ ප්‍රවර්ධනය සඳහා මාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීම වැදගත්වන බවත්;

(iii) මේ වන විට මෝටර් රථ කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ විද්‍යුත් මාධ්‍ය තුළින් ප්‍රචාරණය වන වැඩසටහන් සංඛ්‍යාව ඉතා අල්ප බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, මෝටර් රථ කාර්මික ක්ෂේත්‍රයට අදාළ වැඩසටහන් විද්‍යුත් නාලිකා තුළින් විකාශනය කිරීම සඳහා කාලය වෙන් කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3629/’13

ගරු රෝසි සේනානායක මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම අවට ඛනිජ තෙල් ගවේෂණවල නිරතවී සිටින “Cairn India” නමැති ඉන්දියානු සමාගම මේ වන විට තම නිරීක්ෂණ සිදු කරනු ලබන ප්‍රදේශ කවරේද;

(ii) එම සමාගම මගින්, ඛනිජ තෙල් සොයා ගැනීමට අදාළව මේ දක්වා සිදුකර ඇති වර්ධනීය නිරීක්ෂණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඛනිජ තෙල් ළිං කැනීමෙන් පසු එහි අයිතිය පිළිබඳව පවතින ගිවිසුම්වල ස්වභාවය කවරේද;

(ii) එම ගිවිසුම්වලට අදාළ කාලසීමාවන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2655/’12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වන පරිදි නැගෙනහිර නවෝදය වැඩසටහන යටතේ අපනයන සැකසුම් කලාපයක් ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, එම අපනයන සැකසුම් කලාපය ආරම්භ කර ඇති ප්‍රදේශය කවරේද;

(iii) එම අපනයන සැකසුම් කලාපය ආරම්භ කළ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3198/'12

ගරු රවී කරුණානායක මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මාළු ටින්කිරීමේ කර්මාන්තශාලා සතුව සම්පූර්ණයෙන් ඒකාබද්ධ වූ නිෂ්පාදන කර්මාන්තශාලා තිබේද;

(ii) මෙම කර්මාන්තශාලා සඳහා අල්ලා ගන්නා ලද මාළු ප්‍රමාණය කොපමණද;

(iii) මාළු ටින් කිරීමේ කර්මාන්තශාලා ආරම්භයේ සිට අද දක්වා ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරන ලද මාළු ටින් ප්‍රමාණය කොපමණද;

(iv) මාළු ටින් කිරීමේ කර්මාන්තශාලා ආරම්භයේ සිට අද දක්වා කාලය තුළ දේශීය වශයෙන් නිෂ්පාදිත ටින් මාළු ශ්‍රී ලංකාව තුළ අලෙවි කරන ලද්දේ කුමන ලේබලයක් හෝ වෙළඳ සන්නාමයක් යටතේද;

(v) ඉහත සඳහන් මාළු ටින් කිරීමේ කර්මාන්තශාලා විසින් ආරම්භයේ සිට ගෙවනු ලැබූ දේශීය බදු මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3524/'13

ගරු බුද්ධික පතිරණ මහතා;— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොග්ගල ගුවන් හමුදා කඳවුර අසල රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට අයත් නිවාස සංකීර්ණයක් පිහිටා ඇති බව දන්නේද;

(ii) එම නිවාස සංකීර්ණයේ ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිවාස ව්‍යාපෘතිය සඳහා වැයකරන ලද මුළු මුදල කොපමණද;

(iv) ඒ සඳහා අරමුදල් සපයනු ලැබූ මූලාශ්‍ර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වන විට ඉහත නිවාස සංකීර්ණයෙන් පදිංචිය සඳහා ලබා දී ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය මෙතෙක් මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා ලබා දී නොමැති නම්, එය ජාතික ධනය විනාශ කිරීමක් බව පිළිගන්නේද;

(iii) එසේ නම්, සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා හෝ වෙනත් ඵලදායි කටයුත්තකට එම නිවාස ව්‍යාපෘතිය යොදා ගැනීමට සැලසුම් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 07 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2656/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වන පරිදි කිරි ගොවීන්ගේ ජීවන තත්ත්වය නැංවීම සඳහා නැගෙනහිර නවෝදය වැඩසටහන යටතේ කිරි ගොවි ගම්මාන 100 ක් ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, එම කිරි ගොවි ගම්මාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3156/'12

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුරැකුම්පත් සහ විනිමය කොමිසමේ කාර්යභාරය කවරේද;

(ii) කොළඹ කොටස් හුවමාරුවේ කාර්යභාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සුරැකුම්පත් සහ විනිමය කොමිසමේ හිටපු සභාපතිවරුන් වන ඉන්ද්‍රානි සුගතදාස මහත්මිය සහ තිලක් කරුණාරත්න මහතා විසින් හෙළි කරන ලද, 2011 සහ 2012 වර්ෂවලදී කොටස් වෙළඳපොළ මෙහෙයුම්වලට අදාළව සිදුවූ බවට වාර්තාවූ "මාෆියා" ක්‍රියාකාරකම් පිළිබඳව විමර්ශන සිදු කර තිබේද;

(ii) එම විමර්ශනවල වර්තමාන තත්ත්වය කවරේද;

(iii) ඒ සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියාමාර්ග නොගැනීමට හේතු කවරේද;

(iv) ක්‍රියාමාර්ග ගෙන සමථයකට පත් කරන ලද සිද්ධීන් සංඛ්‍යාව කොපමණද;

(v) එම් බේරුම්කිරීම්වල පිරිවැය කවරේද;

(vi) එම බේරුම්කිරීම් දේශපාලන බලපෑම් මත සිදුවූ ඒවාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3381/'12

ගරු පී. හැරිසන් මහතා,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන අලි ප්‍රහාර නිසා මියයන පුද්ගලයන් වෙනුවෙන් වන්දි ලබාදෙන ක්‍රමවේදය කවරේද;

(ii) එම වන්දි ලබාදීම ආරම්භ කළ වර්ෂය කවරේද;

(iii) වන්දි ගෙවීමේදී එක් පුද්ගලයෙකුට ලබාදෙන මුදල කොපමණද;

(iv) එම මුදල ප්‍රමාණවත් වන්නේද;

(v) එකී මුදල වැඩි කිරීමට පියවර ගන්නේද;

(vi) එසේ නම්, වැඩිකරනු ලබන මුදල සහ වැඩි කිරීම සිදු කරන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වන අලින්ගෙන් සිදුවන වගා හානි සඳහා වන්දි ගෙවන්නේද;

(ii) එසේ ගෙවනු ලබන වන්දි මුදල කොපමණද;

(iii) වගා හානි වන්දි මුදල තීරණය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iv) වන අලි පහරදීම සහ වගා හානි හේතුවෙන් ගොවීන්ට සිදුවන අලාභ ආවරණය කරන රක්ෂණ ක්‍රමයක් ඇතිකර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වෙඩිතැබීම්, විදුලිසැර වැද්දවීම් හෝ වෙනත් ක්‍රම මගින් වන අලියකු ඝාතනය කරන තැනැත්තෙකුට දඩ මුදලක් නියම කිරීමට හෝ වෙනත් දඬුවමක් ලබාදීමට හැකි නීති පවතින්නේද;

(ii) එසේ නම්, එම නීති යටතේ නියම කළ හැකි දඩ මුදල කොපමණද;

(iii) එම දඩ මුදල නොගෙවන අයෙකු සිරගත කළ හැකි කාල සීමාව කොපමණද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3525/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නුපේ පිහිටි ඕලන්ද පැරණි වෙළඳ සංකීර්ණය පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථානයක් බවත්;

(ii) එයට අයත් ගොඩනැගිලි මේ වන විට ගරාවැටෙමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසු රජයට අමතර ආදායමක් උපයා ගැනීම සඳහා යොදාගත හැකි බව පිළිගන්නේද;

(ii) එසේ නම්, නුපේ ඕලන්ද පැරණි වෙළඳ සංකීර්ණය ප්‍රතිසංස්කරණ කිරීමට කටයුතු කරන්නේද;

(iii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එසේ නම්, වෙන්කර ඇති මුදල කොපමණද;

(v) එහි අලුත්වැඩියා කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3744/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ස්ත්‍රීන්ට එරෙහි සියලුම ආකාරයේ වෙනස්කම් දුරු කිරීමේ ජාත්‍යන්තර සම්මුතිය (CEDAW) සහ කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධ වූ ශ්‍රී ලංකා කාන්තා ප්‍රඥප්තිය යනාදී ජාත්‍යන්තර සහ දේශීය සම්මුති ගණනාවක් පවතින බවත්;

(ii) අදාළ සම්මුති ශ්‍රී ලංකාව විසින් පිළිගෙන ඒවාට අත්සන් තබා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ අසමතුලිතභාවයක් (Gender inequality) පවතින බව පිළිගන්නේද;

(ii) මෙම තත්ත්වය දුරලීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2657/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වන පරිදි සෑම කෘෂිකාර්මික පවුලක් සඳහාම දැනට වගා කරන සෑම බෝගයකටම අදාළ බීජ සහ පොහොර නොමිලේ ලබා දෙන්නේද;

(ii) එසේ නම්, මේ වන විට ඉහත පරිදි බීජ සහ පොහොර නොමිලේ ලබා දී ඇති කෘෂිකාර්මික පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3220/'12

ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේවන විට මෙරට පවතින ජාතික සහ පළාත් වශයෙන් වන රජයේ සමස්ත පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) රජයේ පාසල්වල පළමුවැනි ශ්‍රේණියට වාර්ෂිකව ඇතුළත් කෙරෙන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂයකට අ.පො.ස. (සා/පෙළ) සහ (උ/පෙළ) විභාගවලට පෙනී සිටින සිසුන් සංඛ්‍යාවෙහි සාමාන්‍යය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3528/'13

ගරු බුද්ධික පතිරණ මහතා;— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට;— (1)

(අ) (i) ගාලු කොටුව පැරණි තැපැල් කාර්යාල ගොඩනැගිල්ල පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථානයක් බවත්;

(ii) මේ වන විට එම ගොඩනැගිල්ල ගරාවැටෙමින් පවතින බවත්;

(iii) එම ගොඩනැගිල්ල පිහිටි භූමියෙහි බලහත්කාරයෙන් පදිංචි වූ පුද්ගලයන් සිටින බවට ජනතාව චෝදනා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගාල්ල කොටුව පැරණි තැපැල් කාර්යාලය හා එහි සම්පත් භාවිතයට නොගෙන අත්හැර දැමීම ජාතික අපරාධයක් බවත්, එම කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසු රජයට ආදායමක් උපායාගත හැකි බවත් පිළිගන්නේද;

(ii) එසේ නම්, එම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(iii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iv) එසේ නම්, වෙන් කර ඇති මුදල කොපමණද;

(v) අලුත්වැඩියා කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(vi) එම ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ බලහත්කාරයෙන් පදිංචි අය ඉවත් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 09 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2658/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වන පරිදි ස්වයං රැකියාවල නිරතවීමට කැමති සැමට අදාළ ස්වයං රැකියාවට අවශ්‍ය උපකරණ කට්ටලය බැගින් නොමිලේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ස්වයං රැකියාවලට අවශ්‍ය එම උපකරණ කට්ටල නොමිලේ ලබාදී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3221/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂයේදී ශ්‍රී ලාංකික ජනගහනයේ ප්‍රතිශතය එක් එක් ආගම අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් තොරතුරු 2012 වර්ෂයේ පැවති ජාතික සංගණනයේ තොරතුරු හා සැසඳෙන්නේද;

(iii) බලහත්කාරයෙන් පුද්ගලයින් ආගම්වලට හරවාගැනීම් වාර්තාවීම් එක් එක් දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) බලහත්කාරයෙන් පුද්ගලයින් ආගම්වලට හරවාගැනීම් සිදුකළ පුද්ගලයින්ට එරෙහිව ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3347/'12

ගරු පී. හැරිසන් මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ඇති කුලී පදනම මත ලබාගත් වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබාගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමග අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමිය සඳහන් කරන්නෙහිද ?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3533/'13

ගරු බුද්ධික පතිරණ මහතා;— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට;— (1)

(අ) (i) කිරින්ද, පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකරනු ලබන බවට ජනතාව චෝදනා කරන බව දන්නේද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා එම ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ අනවසරයෙන් ගොඩකර ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම අනවසර ගොඩකිරීම්වලට අදාළව පැමිණිලි ලැබී තිබේද;

(iv) එසේ නම්, ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(v) එම පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(vi) ඒ අනුව ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා කිරින්ද, පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකිරීමට නීත්‍යානුකූල අවසරය ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, ගොඩකිරීම සඳහා අවසර ලබා දී ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම කුඹුරු ඉඩම් ගොඩකිරීමට අවස්ථාව ලබා දීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2659/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වන පරිදි සෑම මූලික රෝහලකම ක්‍රීඩා සෞඛ්‍ය ඒකකයක් ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, එම වැඩසටහන ආරම්භ කළ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3222/'12

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006, 2007, 2008, 2009, 2010, 2011 සහ 2012 යන වර්ෂ සඳහා රාජ්‍ය සේවය තුළ උත්පාදනය කළ රැකියා සංඛ්‍යාව දිස්ත්‍රික් පදනමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කී රැකියා උත්පාදනය කරන ලද අංශයන් කවරේද;

(iii) ඉහත කී රැකියා ලබාදීම සිදුකොට ඇත්තේ අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන්ද;

(iv) පුද්ගලයින් තෝරා ගැනීම කුසලතා පදනම මත සිදුකරන ලද්දේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3348/'12

ගරු පී. හැරිසන් මහතා,— යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවලට කුලී පදනම මත ලබාගෙන ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබාගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමග අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3534/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වැවිලි මානව සංවර්ධන භාරයේ සභාපති, උප සභාපති ඇතුළු අධ්‍යක්ෂවරුන්ගේ,

(i) නම්, උපන් දිනයන් සහ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්;

(ii) වේතන හා දීමනාවල අගයන් සහ වෙනත් වරප්‍රසාද;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වැවිලි මානව සංවර්ධන භාරයේ වත්මන් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වයස් මට්ටම සැලකීමේදී ඔහු එම ධූරයේ පිහිටුවීමට ආයතන සංග්‍රහයේ නීති රීතිවලට අනුව හැකියාවක් තිබේද;

(ii) එම තැනැත්තා රජයේ ආයතන දෙකක තනතුරු දරන බවට එම භාරයේ සේවකයින් චෝදනා කරන බව දන්නේද;

(iii) එසේ නම්, එම ආයතන දෙක කවරේද;

(iv) ඔහුට එම ආයතනවලින් මාසිකව ගෙවනු ලබන වැටුප්, වේතන, වෙනත් දීමනා සහ වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම භාරයේ ප්‍රාදේශීය අධ්‍යක්ෂවරයෙකු වන මර්වින් පෙරේරා නමැත්තා නියමිත වයස ඉක්මවා තිබියදීත් විශ්‍රාම නොයැවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 10 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2368/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාව මගින් පාසල් දරුවන්ට දිවා ආහාරය සඳහා බත් වේලක් නොමිලයේ ලබා දෙන බවට පොරොන්දුවක් ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි සෑම පාසල් දරුවෙකුටම දිවා ආහාරය හිමි වන්නේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iii) මේ වන විට දිවා ආහාරය සඳහා බත් වේලක් ලබා දෙන පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) දිවා ආහාර ලබා දීම සඳහා එම පාසල් තෝරා ගත් පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2522/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උක් පර්යේෂණ ආයතනය සඳහා 2011 වර්ෂයේ අය - වැය ලේඛනය මගින් වෙන් කරන ලද මුදල කොපමණද;

(ii) වෙන් කරන ලද මුදලින් වියදම් කරන ලද සත්‍ය වියදම කොපමණද;

(iii) 2012 අය - වැය මගින් එම ආයතනය සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක් පර්යේෂණ ආයතනය විසින් භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතුවල මුදල් ආයෝජනය කර තිබේද;

(ii) එසේ නම්, එලෙස ආයෝජනයකර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2818/'12

ගරු රවි කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගනයට අදාළව,

(i) මාසික සහ වාර්ෂික නඩත්තු පිරිවැය සහ පොලී පිරිවැය කොපමණද;

(ii) ණය ගැනුම්වල ප්‍රාග්ධන පිරිවැය කොපමණද;

(iii) අපේක්ෂිත මාසික ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගන ව්‍යාපෘතියේ ණය ආපසු ගෙවීමේ කාල සීමාව කොපමණද;

(ii) මෙම කාල සීමාව සඳහා මුදල් හිඟය කොපමණද;

(iii) මෙම ව්‍යාපෘතියේ සියලු ණය හිමියන් සඳහා මේ වන විට මුදල් ගෙවනු ලබන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3350/'12

ගරු පී. හැරිසන් මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඛණිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ පවතින රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවලට කුලී පදනම මත ලබා ගෙන ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබාගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමග අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

3745/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වන විට රාජ්‍ය සේවයේ සිටින,

(i) සමස්ත සේවක සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාවෙන් කාන්තා ප්‍රතිශතය;

(iii) අමාත්‍යාංශ ලේකම්වරු සංඛ්‍යාව;

(iv) අමාත්‍යාංශ ලේකම්ධුර දරන කාන්තාවන් සංඛ්‍යාව;

(v) අමාත්‍යාංශ ලේකම්ධුර නොදරන ශ්‍රී ලංකා පරිපාලන සේවා නිලධාරීන් සංඛ්‍යාව;

(vi) ඉහත (v) හි නිලධාරීන් අතර සිටින කාන්තා නිලධාරීන් සංඛ්‍යාව;

(vii) එක් එක් ශ්‍රේණි මට්ටම අනුව එම නිලධාරිනියන්ගේ ප්‍රතිශතය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2370/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ, "සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය" යළි ක්‍රියාවට නංවන බවට පොරොන්දුවක් ලබා දී ඇති බව දන්නේද;

(ii) ඉහත පොරොන්දුව ලබා දී වර්ෂ කිහිපයක් ගත වී ඇතත් මෙතෙක් එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පමාවීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ වැඩිපුරම භාවිතා වන ඖෂධ වර්ග දේශීයව නිෂ්පාදනය කිරීමට පියවර ගන්නා බවට වූ "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ යෝජනාව පරිදි මේ වන විට දේශීයව නිපදවන ඖෂධ වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඖෂධ වර්ග කවරේද;

(iii) දේශීයව ඖෂධ නිපදවීම සඳහා වර්ෂයකට වැය කරන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2703/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ මේවන විට ක්‍රියාත්මකව පවතින පිරිවෙන්වල සේවය කරනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුරුවරුන්ට රජයේ පාසල්වල සේවය කරනු ලබන ගුරුවරුන් සඳහා ලැබෙන නිදහස් දුම්රිය ප්‍රවේශපත්‍ර, අඩු පොලිය මත ලබා දෙන දේපළ ණය සහ ආපදා ණය ලබා නොදෙන බව දන්නේද;

(iii) එක සමාන සේවාවක් ඉටු කරනු ලබන ගුරුවරුන් සඳහා ඉහත පරිදි ආකාර දෙකකට සැලකීම යුක්ති සහගත නොවන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එම තත්ත්වය මඟහැරීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2819/'12

ගරු රවී කරුණානායක මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව වෙත ගුවන් ගමන් සේවා සපයන ගුවන් සේවා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුවන් සේවාවන්හි නම් කවරේද;

(iii) ඒවා ස්ථිර ගුවන් සේවාවන්ද; නොඑසේ නම්, කුලී පදනමින්වන ගුවන් යානා සේවාවන්ද;

(iv) එම ගුවන් සේවාවන්ට හයවැනි පියාසර නිදහස (sixth freedom of traffic) එනම් වෙනත් රටවල් දෙකක් අතර සේවා සැපයීම අතරතුරදී තම රටේද නතර වී යළි පියාසර කිරීමේ අයිතිය පවතීද;

(v) මෙම සියලුම ගුවන් සේවාවන් මගින් මසකට ප්‍රවාහනය කළ හැකි මුළු මගීන් සංඛ්‍යාව කොපමණද;

(vi) පසුගිය වර්ෂයේදී මෙරටට පැමිණි මුළු සංචාරකයන් සංඛ්‍යාව කොපමණද;

(vii) සංචාරක පැමිණීම් සම්බන්ධ ඉලක්ක සපුරා ගැනීම සඳහා මෙම ගුවන් සේවාවන් උපකාරී වන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 11 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1652/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) මොනරාගල සහ බදුල්ල දිස්ත්‍රික්කවල වර්ෂ ගණනාවක සිට අඛණ්ඩව සේවයේ නිරතවන පාසල් අනධ්‍යයන සේවකයින්ගේ සේවය මෙතෙක් ස්ථිර කර නොමැති බවත්;

(ii) 2005 සහ 2008 වර්ෂවලදී බඳවා ගෙන ඇති මෙම පිරිස මේ දක්වා සුළු දෛනික වැටුපකට සේවය කරනු ලබන බවත්;

(iii) එම තත්ත්වය යටතේ ඔවුන් ආර්ථික දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම අනධ්‍යයන සේවක පිරිස ස්ථිර කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබියදීත් ඔවුන්ගේ සේවය ස්ථිර නොකිරීමට හේතු කවරේද;

(ii) එම හේතු මගහරවා ඔවුන් ස්ථිර සේවක පිරිසට අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1850/'11

ගරු රවී කරුණානායක මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) පසුගිය වර්ෂ පහක කාලය තුළ, එක් එක් වර්ෂයේදී, එක් එක් වරායට අදාළව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විශාලතම පිරිවැය ඉහළයාම් 10 සිදුවූයේ කවර කාර්යයන් සඳහාද;

(ii) ඉහත (i) හි සඳහන් පිරිවැය තීරණය කිරීමේදී සියලුම සාධක එක්ව සැලසීම මගින් ඇතිවූ ඒකාබද්ධ සමස්ත බලපෑම කවරේද;

(iii) පිරිවැය වැඩිවීමට සමානුපාතිකව ආදායමේ වැඩිවීමක් සිදුවී තිබේද;

(iv) නොඑසේ නම්, එම මූල්‍ය හිඟය පියවාගත් ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ 6ක කාලය තුළ එක් එක් වර්ෂයේදී, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ එක් සේවකයෙකු වෙනුවෙන් වූ අයභාරය, පිරිවැය, ලාභය සහ අගය එකතු කිරීම කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2260/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) 2012 අයවැය යෝජනා මගින් විශ්වවිද්‍යාල සිසුන් සඳහා දැනට ලබා දෙන මහපොළ ශිෂ්‍යත්ව මුදල වැඩි කිරීමට පියවර ගෙන තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3356/'12

ගරු පී. හැරිසන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ඇති කුලී පදනම මත ලබාගත් වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබාගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමඟ අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3409/'13

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2006 සිට 2012 දක්වා කාල සීමාව තුළ,

(i) ශ්‍රී ලංකාව තුළ නිපදවන ලද මත්ස්‍ය ප්‍රමාණය;

(ii) එහි වටිනාකම;

(iii) දළ දේශීය නිෂ්පාදිතයේ හෝ දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස එම වටිනාකම;

කොපමණද යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2006 සිට 2010 දක්වා කාල සීමාව තුළ අපනයනය කරන ලද මත්ස්‍ය ප්‍රමාණය;

(ii) 2006 සිට 2012 දක්වා කාල සීමාව තුළ ආනයනය කළ මත්ස්‍ය ප්‍රමාණය සහ අපනයනය කළ ටින් මාළු ප්‍රමාණය;

(iii) 2006 සිට 2012 දක්වා කාල සීමාවේදී අපනයනය හා ආනයනය කළ කරවල උම්බලකඩ, ඉස්සන් සහ වෙනත් මත්ස්‍ය නිෂ්පාදන ප්‍රමාණය;

(iv) ඉහත සඳහන් එක් එක් ද්‍රව්‍යවල ආනයන වටිනාකම සහ අපනයන වටිනාකම;

කොපමණද යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3576/'13

ගරු සුජීව සේනසිංහ මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) තැපැල් සේවාව ජාල ගතකිරීම සඳහා රුපියල් කෝටි 30කට අධික මුදලක් වැය කර ඇති බවත්;

(ii) එම ව්‍යාපෘතියට ලබාගත් පරිගණක හා උපාංග වර්ෂ 5ක් තිස්සේ ප්‍රයෝජනයට ගෙන නොමැති බවත්;

(iii) මිලදී ගත් පරිගණකවල වගකීම් කාලය මේ වන විට ඉක්මවා ගොස් ඇති බවත්;

(iv) එම ව්‍යාපෘතිය පවරා ඇති පුද්ගලයා දූෂණ චෝදනාවකට වරදකරු වී ඇති බවත්;

(v) ඉහත ගනුදෙනුව සම්බන්ධයෙන් තමාට දැනුමක් නැති බව සඳහන් කරමින් තැපැල්පතිවරයා වගකීමෙන් මඟහැර සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ව්‍යාපෘතිය වෙනුවෙන් මුලින් ලබාගත් රුපියල් කෝටි 30ට අමතරව තවත් රුපියල් කෝටි 35ක් තැපැල් දෙපාර්තමේන්තුව මඟින් ඉල්ලුම් කිරීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3743/'13

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) රටෙහි පවතින බදු ක්‍රමය පිළිබඳව අධ්‍යයනය කර රජයේ ආදායම් වැඩිකිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස ජනාධිපතිතුමා විසින් 2009 වර්ෂයේ හෝ ඒ ආසන්න කාලයකදී කොමිසමක් පත්කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී කොමිසම පත්කරන ලද නිවැරදි දිනය කවරේද;

(ii) එකී කොමිසමේ සාමාජිකයින්ගේ නම් සහ ඔවුන් අනුබද්ධ ආයතන කවරේද;

(iii) එකී කොමිසමේ වාර්තාව සකස් කර අවසන් කළ දිනය සහ එම වාර්තාව ජනාධිපතිතුමා වෙත භාර දුන් දිනය කවරේද;

(iv) එකී වාර්තාව සභාගත කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එකී කොමිසම පත්කිරීමට පෙර වර්ෂයේ රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස කවරේද;

(ii) 2012 වර්ෂයේ රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3746/'13

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 6 වැනි ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වා ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබාදෙන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද යන්න දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උසස් පෙළ පමණක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබාදෙන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) රජයේ ඉංග්‍රීසි මාධ්‍ය පාසල් අධ්‍යාපනය සෑහීමකට පත්විය හැකි මට්ටමක පවතින්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 12 වැනි බ්‍රහස්පතින්දා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1941/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, දෙණියාය මැතිවරණ බල ප්‍රදේශයේ පිහිටි අලපලාදෙණිය ප්‍රාදේශීය තේ ව්‍යාප්ති මධ්‍යස්ථානයට අයත් ගොඩනැගිලි සහ තේ වගා කරන ලද භූමිය භාවිතයට නොගෙන අත්හැර දැමීම හේතුවෙන් වල්බිහි වෙමින් පවතින බවත්;

(ii) මෙම මධ්‍යස්ථානය ප්‍රයෝජනයට නොගෙන අත්හැර දමා තිබීම ජාතික අපරාධයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අලපලාදෙණිය ප්‍රාදේශීය තේ ව්‍යාප්ති මධ්‍යස්ථානය අතහැර දැමීමට හේතු කවරේද;

(ii) එම මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කර ඒ තුළින් ප්‍රදේශයේ තේ වගාකරුවන්ගේ ක්ෂේත්‍ර ගැටලු සඳහා උපදෙස් සලසාදීමට කටයුතු කරන්නේද;

(iii) ඊට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2245/'12

ගරු රවී කරුණානායක මහතා,— සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ඇති ලෝක උරුම ස්ථානයන් කවරේද;

(ii) එවැනි දර්ශනීය ස්ථානයන් මනා තත්ත්වයෙන් පවත්වාගෙන යාම සහ නඩත්තු කිරීම වෙනුවෙන් වැය කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) පසුගිය වර්ෂ තුනක කාලය තුළ, දේශීය ලෝක උරුම ස්ථානයන් නැරඹීම සඳහා පැමිණි පුද්ගලයන් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පසුගිය වර්ෂ තුනක කාලය තුළ, එම ස්ථානවලින් උපයා ගන්නා ලද ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2010 සහ 2011 වර්ෂයන්හිදී ඉහත කී ස්ථානයන්හි ඍජු හා වක්‍ර ලෙස සේවයේ යෙදී සිටි පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2343/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති මාලාව මගින් ලංකාවේ උපදින සෑම දරුවකුගේම ජීවදත්ත ගොනුවක් එම දරුවාගේ ස්ථිර පදිංචියට අදාළ ජන සභා ලේකම් කාර්යාලයේ පවත්වාගෙන යා යුතු බවට යෝජනාවක් ඉදිරිපත් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට එම යෝජනාව ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ වර්ෂය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3358/'12

ගරු පී. හැරිසන් මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ඇති කුලී පදනම මත ලබාගත් වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබාගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමඟ අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3601/'13

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොරියානු රැකියා අවස්ථා සඳහා 2012 වර්ෂයේ පැවැත්වූ කොරියානු භාෂා විභාගයෙන් සමත් වූ අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් 2012 වර්ෂය තුළ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා කොරියානු රැකියා සඳහා පිටත්ව ගොස් ඇති ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එසේ යවනු ලැබූ අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3630/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සබරගමුව විශ්වවිද්‍යාලයේ,

(i) කළමනාකරණ පීඨයේ ආචාර්යවරුන්ගේ හිඟයක් පවතීද;

(ii) එම පීඨයේ සිටින මහාචාර්යවරු සංඛ්‍යාව කොපමණද;

(iii) භූ විඥාපන පීඨයේ ආචාර්යවරුන්ගේ සහ අනෙකුත් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ හිඟයක් පවතීද;

(iv) සමාජ විද්‍යා හා භාෂා පීඨයේ ආචාර්යවරුන්ගේ හිඟයක් පවතීද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3774/'13

ගරු විජිත බේරුගොඩ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වර්ෂ 1987 දී ශ්‍රී ලංකා රජය හා ඉන්දියානු රජය අතර ගරු ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමන් හා ගරු රජීව් ගාන්ධි අග්‍රාමාත්‍යතුමන් විසින් අත්සන් තබන ලද ගිවිසුම් කවරේද;

(ii) එම ගිවිසුම් අත්සන් කරන ලද දිනය හා ගිවිසුම්වල අන්තර්ගත වූ කාරණා සංක්ෂිප්තව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3912/'13

ගරු රුවන් රණතුංග මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ත්‍රිවිධ හමුදාවේ වෛද්‍ය සේවයෙන් නීත්‍යානුකූලව ඉවත්වූ වෛද්‍යවරුන් නැවත රජයේ වෛද්‍ය සේවයට බඳවා ගැනීමේදී සේවා පළපුරුද්ද, ශ්‍රේණිය හා ජ්‍යෙෂ්ඨත්වය නොසලකා ඔවුන් ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය තනතුරේ පිහිටුවාලීමේ අසාධාරණ ක්‍රමවේදයක් පවතින බවත්;

(ii) හමුදා සේවයෙන් ඉවත්ව තවදුරටත් රටට සේවය කිරීමට කැමති බොහෝමයක් වෛද්‍යවරුන්ගේ රට හැරයෑමට එම තත්ත්වය හේතුවී ඇති බවත්;

(iii) එවැනි තත්ත්වයක් යටතේ වුවද, රජයේ වෛද්‍ය සේවයට ඇතුළත්වූ වෛද්‍ය එම්. ඩී. ඩබ්ලිව්. ලොකුගේ ඇතුළු වෛද්‍යවරුන් ගණනාවක් මේ වනවිට බලවත් අසාධාරණයකට ලක්වෙමින් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රේණිය පහත හෙළා එම වෛද්‍යවරුන් රජයේ වෛද්‍ය සේවයට බඳවා ගැනීම හමුදා සේවය යටතේ ඔවුන් රටට කළ සේවය වරදක් සේ සලකා කරනු ලබන දඬුවම්දීමක් නොවන්නේද;

(ii) යුද්ධය පැවති අවධියේ ඔවුන් ස්වකැමැත්තෙන් ත්‍රිවිධ හමුදාවේ වෛද්‍ය බලකායට එක් වී සිදු කළ සේවය ඇගයීමට ලක් නොකිරීමට හේතු කවරේද;

(iii) එම වෛද්‍යවරුන් බඳවා ගැනීමේදී ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 17 වැනි වගන්තිය යටතේ දැක්වෙන අනු වගන්තීන් හා 14.4 සහ VII වැනි පරිච්ඡේදයේ 9.3 හා 9.4 වගන්තීන්ට අනුවත් දියහැකි අනුග්‍රහ ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 13 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1946/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) දැනට වර්ෂයක පමණ කාලයක සිට, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන පිහිටා ඇති සුදු කොහු කර්මාන්තශාලාව වසා දමා ඇති බැවින් ප්‍රදේශයේ විශාල ජනතාවකට රැකියා අහිමිව දැඩි ආර්ථික දුෂ්කරතාවන්ට මුහුණපෑමට සිදුවී ඇති බවත්;

(ii) එම සුදු කොහු කර්මාන්තශාලාව ආශ්‍රිත මධ්‍යස්ථානය මගින් රැකියා නොමැති තරුණ තරුණියන් ස්වයං රැකියාවලට යොමුකිරීමේ අරමුණින් පුහුණු පාඨමාලාවක් ද පවත්වාගෙන ගිය බවත්;

(iii) නව නිර්මාණ සඳහා ජනාධිපති සම්මාන පවා හිමි කරගත් එම ආයතනය වසා දැමීම ජාතික අපරාධයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, නැවතත් මෙම කර්මාන්තශාලාව ආරම්භ කරන්නේද;

(ii) ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2314/'12

ගරු රවී කරුණානායක මහතා,— කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) මේ වනවිට,

(i) මෙරට සේවකයන් විසින් හිමිකාරීත්වය දරනු ලබන සේවක අර්ථසාධක අරමුදලේ (EPF) මුළු වටිනාකම කොපමණද;

(ii) සේවක අර්ථසාධක අරමුදල විසින් මුදල් ආයෝජනය කර ඇති ආයතනවල නම් කවරේද;

(iii) සේවක අර්ථසාධක අරමුදලේ සාමාජික සංඛ්‍යාව කොපමණද;

(iv) සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් නොගෙවන සාමාජික සංඛ්‍යාව කොපමණද;

(v) එසේ දායක මුදල් නොගෙවන සේවක අර්ථසාධක අරමුදල් සාමාජිකයින්ගෙන් මුදල් එකතු කර නොගැනීමට හේතු කවරේද;

(vi) සාමාජිකයින්ගේ එකතු කරගෙන නොමැති මුදල් ප්‍රමාණයෙහි වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2362/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උලහිටියාව බටහිර ග්‍රාම නිලධාරි වසමේ, වැලිපිටිය - ඉඹුල්ගොඩ මාර්ගයේ අඹගස්ආර හංදියේ සිට ඉදිරියට කිලෝ මීටර් 1½ ක් පමණ කොන්ක්‍රීට් අතුරා ඇති බවත්;

(ii) පළාත් නිශ්චිත ප්‍රතිපාදනවලින් රු. 1,287,312/- ක පමණ ඇස්තමේන්තුවක් එම කටයුත්ත සඳහා ඉදිරිපත් කර ඇති බවත්;

(iii) නියමිත ප්‍රමිතීන්ට අනුව පිළිසකර නොකිරීම නිසා දැනටමත් එම මාර්ගය ගිලා බැස ඇති බවත්;

(iv) එසේ වුවද ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ හා කාර්මික නිලධාරියාගේ විරුද්ධත්වය නොතකා රජයේ වගකිව යුතු නිලධාරීන්ගේ බලපෑම් මත එහි කොන්ත්‍රාත්කරුට මුදල් ගෙවා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මාර්ගයේ ඉදිකිරීම් පිළිබඳ ස්ථානීය තත්ත්ව පරීක්ෂණ වාර්තාවන් ලබාගෙන මෙම මුදල් නාස්තිය පිළිබඳ වගකිව යුතු නිලධාරීන්ගෙන් අයථා ලෙස ගෙවා ඇති මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3265/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මිල්කෝ සමාගමේ අඹේවෙල ශාඛාවේ කිරි ගබඩා කර තැබීමේ පහසුකම් නොමැති බව දන්නේද;

(ii) අඹේවෙල ශාඛාවේ ගබඩා පහසුකම් නොමැතිවීම නිසා කිරිපිටි නිපදවීම සඳහා ක්‍රීම් බවට පත්කර තිබියදී ඉවත් කරන ලද කිරි ලීටර් සංඛ්‍යාව කොපමණද;

(iii) එම කිරිවල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මිල්කෝ සමාගමේ මාසික ආදායම සහ ශුද්ධ ලාභය කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3426/'13

ගරු පී. හැරිසන් මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 දෙසැම්බර් මාසයේ ඇතිවූ ගංවතුර විපත්වලින් ආපදාවලට ලක්වූ හෝ හානියට පත්වූ කුඹුරු අක්කර ප්‍රමාණය එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ආපදාවලට ලක්වූ ඉහත සඳහන් කුඹුරු ප්‍රමාණය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) හානියට පත් එම කුඹුරු වෙනුවෙන් වන්දි මුදල් ලබාදීම කුමන ආයතනයක් හරහා සිදුකරනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3686/'13

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුවේට් රාජ්‍යයේ රැකියා සඳහා ගොස් ඇති ශ්‍රී ලාංකික කාන්තාවන් 300කට වැඩි පිරිසක් එහිදී ඔවුන්ට මුහුණපෑමට සිදුවී ඇති විවිධ තාඩන, පීඩන සහ අතවර හේතුවෙන් සේවා ස්ථානවලින් පැනයාම නිසා වෙනත් කිසිදු චෝදනාවක් නොමැතිව පොලිස් අත්අඩංගුවේ සහ සිර කඳවුරුවල රඳවාගෙන සිටින බවත්;

(ii) එලෙස කරදර හිරිහැරවලට ලක්ව සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ගේ දුක් ගැනවිලි සම්බන්ධයෙන් සොයාබලා ක්‍රියාකිරීම සඳහා කුවේටිහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට අනුයුක්ත කර ඇති ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරීන්ගෙන් එම ගැටලු විසඳීම සඳහා ක්‍රමවත්, කඩිනම් ප්‍රතිචාරයන් නොලැබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) දැනට ක්වේට් රාජ්‍යයේ කඳවුරුවල රඳවා සිටින පිරිස් කඩිනමින් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3936/'13

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අභ්‍යාසලාභී ගුරු පුහුණු අවසන් පරීක්ෂණය අවසන් වතාවට පවත්වන ලද වර්ෂය කවරේද;

(ii) විවිධ හේතු මත අවසන් පරීක්ෂණයට ඉදිරිපත්වීමට නොහැකි වූ හා ඒ නිසා පුහුණු සහතිකය නොලැබුණු අභ්‍යාසලාභී ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(iii) උක්ත ගුරුවරුන් උදෙසා විශේෂ පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දින වකවානු කවරේද;

(v) ඉහත (iii)හි සඳහන් පරිදි කටයුතු නොකරන්නේ නම්, එකී අභ්‍යාසලාභී පුහුණු සහතික නොලත් ගුරුවරුන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4173/'13

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතට ගැනෙන ව්‍යවස්ථාපිත ආයතනයක්ද;

(ii) නොඑසේ නම්, එය අමාත්‍යාංශ වගකීමක් රහිත ස්වාධීන ආයතනයක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ,

(i) ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා කවුරුන්ද;

(ii) මුදල් මණ්ඩලයේ කාර්යභාරය කවරේද;

(iii) කළමනාකරණ හා පරිපාලන තීරණවල අවසන් බලධරයා කවුරුන්ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා මහ බැංකුවට සේවකයින් බඳවා ගැනීමට අදාළව අනුමත පරිපාටියක් හා වැටුප් ව්‍යුහයක් තිබේද;

(ii) එසේ නම්, එය අනුමත කර ඇති බලධාරියා කවුරුන්ද;

(iii) ඒ සඳහා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමතිය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩල වැටුප් ප්‍රතිශෝධනය කරන ආකාරය සහ ඒ සඳහා යොදා ගන්නා නිර්නායකයන් කවරේද;

(ii) ඉහත (ඇ)(i)හි සඳහන් අනුමත බඳවා ගැනීමේ පරිපාටිය හා වැටුප් ව්‍යුහය සභාගත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2013 දෙසැම්බර් මස 14 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1949/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට අයත් නක්කල සතිපොළ මීට වර්ෂයකට පමණ පෙර විවෘත කළ බවත්;

(ii) විවිධ පුද්ගලයන්ගේ බලපෑම් නිසා මේ වන විට වෙළෙඳුන්ට එහි පැමිණ වෙළඳාම් කිරීමට නොහැකිවී ඇති බවත්;

(iii) ඒ නිසාම සතිපොළ පාළුවට ගොස් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නක්කල සතිපොළෙහි පවත්නා මෙම තත්ත්වය මඟහරවා වෙළෙඳුන්ට නිදහසේ වෙළඳාම් කිරීමටත් ඔවුන්ට ආරක්‍ෂාව සම්බන්ධයෙන් පවත්නා ගැටලු විසඳාදීමටත් කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගත වන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2318/'12

ගරු රවී කරුණානායක මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2011 වර්ෂයට අදාළව,

(i) නිවාස ඉදිකිරීම වෙනුවෙන් ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය විසින් වැය කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිවාස ඉදිකරනු ලැබ ඇති ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2012 වර්ෂයට අදාළව,

(i) නිවාස සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) මේ වන විට ඒ සඳහා වැය කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) අලුතින් ඉදිකරන ලද නිවාස පිහිටා ඇති ස්ථාන කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2371/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ තැලසීමියා රෝගය ව්‍යාප්තව පවතින දිස්ත්‍රික්ක කවරේද;

(ii) වර්ෂ 2005 සිට 2011 දක්වා වාර්තා වී ඇති තැලසීමියා රෝගීන් සංඛ්‍යාව හා මරණ සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වන විට තැලසීමියා රෝගය ව්‍යාප්ත වී ඇති දිස්ත්‍රික්කවල වෙසෙන සමස්ත තැලසීමියා රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iv) වැඩිම තැලසීමියා රෝගීන් සංඛ්‍යාවක් සිටින සහ එම රෝගයෙන් වැඩිම මරණ සංඛ්‍යාවක් වාර්තාවන දිස්ත්‍රික්කය කවරේද;

(v) එම මරණ සංඛ්‍යාව කොපමණද;

(vi) එම දිස්ත්‍රික්කයේ සිටින තැලසීමියා රෝගීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) තැලසීමියා රෝගය සඳහා ස්ථිර ප්‍රතිකාර ක්‍රමයක් තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රමය ලංකාවේ ක්‍රියාත්මක වන්නේද;

(iii) තැලසීමියා රෝගීන් සඳහා ලබා දෙන එන්නත් වර්ගය කවරේද;

(iv) එම එන්නත ආනයනය කරන රට කවරේද;

(v) එන්නත් ආනයනය සඳහා වාර්ෂිකව වැය වන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3427/'13

ගරු පී. හැරිසන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජල ගැලීම් නිසා හානියට පත් එළවළු, පලතුරු හා ධාන්‍ය වගාවන් වෙනුවෙන් ඒවා වගා කළ ගොවීන්ට ආධාර ලබා දෙන්නේද;

(ii) එසේ නම්, අක්කරයක් සඳහා ලබා දෙන වන්දි මුදල කොපමණද;

(iii) එසේ වන්දි ගෙවීමක් සිදු නොකරන්නේ නම්, එම ගොවීන්ට ලබා දෙන සහන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3900/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 මාර්තු හා අප්‍රේල් මාසවලදී රජයේ රෝහල්වල ඇතිවූ දැඩි ඖෂධ හිඟය පිළිබඳව දන්නේද;

(ii) එම කාල සීමාවේදී හිඟ වූ ඖෂධ කවරේද;

(iii) ඉහත ඖෂධවල හිඟය පැවති රජයේ රෝහල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත මාස 2 තුළදී රජයේ රෝහල්වල දිනකට මියගිය රෝගීන්ගේ ප්‍රතිශතය කොපමණද;

(v) ඉහත කාල සීමාවේදී මහරගම පිළිකා රෝහලට අවශ්‍යවූ ඖෂධවලින් නොලැබුණු ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1955/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ගා/ප්‍රජාපතී ගෝතමී බාලිකා විද්‍යාලයට පෞද්ගලික හිමිකරුවකු විසින් වර්ෂ තුනකට පමණ පෙර පරිත්‍යාග කරන ලද අම්බලන්ගොඩ විලේගොඩ පිහිටි තෙමහල් නිවස මේ දක්වා කිසිදු ප්‍රයෝජනයකට නොගෙන දිරාපත්වෙමින් පවතින බවත්;

(ii) අබලන් තත්ත්වයේ පවතින ඉහත නිවස පාසලේ අධ්‍යාපනය ලබන සිසුවියන්ගේ ජීවිතවලට තර්ජනයක්ව ඇති බවත්;

(iii) එම ගොඩනැගිල්ල කඩා ඉවත් කර එම ස්ථානයේ රැස්වීම් ශාලාවක් ඉදිකර දෙන ලෙස විදුහල්පතිතුමිය විසින් අවස්ථා ගණනාවකදී අදාළ බලධාරීන්ගෙන් ඉල්ලා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) විදුහල්පතිතුමියගේ ඉහත ඉල්ලීම අනුව කටයුතු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(ii) එසේ නම්, එම ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2322/'12

ගරු රවී කරුණානායක මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2010, 2011 සහ 2012 වර්ෂයන්හි පළාත් සභා 9 සඳහා වෙන්කොට තිබූ සමස්ත අරමුදල් ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත කී වර්ෂයන් තුළ අරමුදල් ලබා දී ඇති, එක් එක් පළාත් සභාවට අයත් අමාත්‍යාංශයන් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2010, 2011 සහ 2012 වර්ෂයන්හිදී,

(i) එක් එක් පළාත් සභාව විසින්, රජයේ ප්‍රතිපාදනවලින් වියදම් කොට තිබූ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) පළාත් සභාව විසින්ම උපයාගත් මුදලින් කළ වියදම්වල වටිනාකම කොපමණද;

(iii) රජයේ ප්‍රදානයන් සහ ආදායම් බෙදාගැනීම් ලෙස එක් එක් පළාත් සභාව විසින් ලබා ගන්නා ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එක් එක් පළාත් සභාවන්හි අයවැය අවශ්‍යතාවන්හි හිඟය පියවා ගන්නා ආකාරය කවරේද;

යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඇ) ඉහත කී පළාත් සභාවන්ට මධ්‍යම ආණ්ඩුව සතු බලතල ලබා දීමෙන් අනතුරුව, පළාත් සභාවන්හි ආදායම් එකතු කිරීමේ ක්‍රමවේදය වැඩිදියුණු වී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2437/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරුවල වැඩ ආවරණය කරනු ලබන වැඩබලන අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ,

(i) සංඛ්‍යාව කොපමණද;

(ii) නම් හා වත්මන් සේවා ස්ථාන කවරේද;

(iii) පත්වීම් සිදු කිරීමට පෙර ඒ සඳහා අයදුම්පත් කැඳවූයේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වැඩබලන අධ්‍යක්ෂවරුන් ලෙස පත්වීම් ලද අයගේ,

(i) පෙර සේවා ස්ථාන කවරේද;

(ii) ශ්‍රී ලංකා ගුරු සේවයේ හෝ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පන්ති හා ශ්‍රේණි කවරේද;

(iii) වෘත්තීය හා ශාස්ත්‍රීය සුදුසුකම් කවරේද;

(iv) පත්වීම් සිදු කරන ලද්දේ කවරකු විසින්ද;

යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාව පරිදි අධ්‍යක්ෂ තනතුරුවල වැඩ ආවරණය කරන නිලධාරීන් පත් කිරීමට නොහැකි බවත්;

(ii) එම සේවයේ තනතුරු සඳහා වැඩබැලීමේ පත්වීම් ලබාදීමට හැක්කේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පමණක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) මේ වනවිට ඉහත සේවයේ ඇති නිත්‍ය තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුරප්පාඩු පිරවීම සඳහා සේවා ව්‍යවස්ථාව අනුව ගැසට් නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවා, සුදුසු නිලධාරීන් බඳවා ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 17 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2606/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ ප්‍රධාන නිරීක්ෂණ හා නිර්දේශයන්හි සාරාංශයේ, 67 වැනි පිටුවේ ඇති, පිට පළාත්වල සේවය කරන පොලිස් නිලධාරීන්ට පරීක්ෂණ පැවැත්වීම හා අධිකරණයේ නඩු පැවරීම පිළිබඳ විශේෂඥ නීති දැනුම ලබා ගැනීමට අවශ්‍ය ප්‍රවේශයන් නොමැති බවට වන සඳහන පිළිගන්නේද;

(ii) පිට පළාත්වල පොලීසිවලට උපදේශනයට හා මග පෙන්වීමට නීතිපති දෙපාර්තමේන්තුවේ ඒකක පිහිටුවන ලෙස ඉහත කොමිෂන් සභාව විසින් කරන ලද නිර්දේශය ක්‍රියාත්මක කරනු ලබන්නේද;

(iii) එසේ නම්, ඒ කවර දිනක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2997/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2009 සිට 2012 දක්වා කාල සීමාව තුළ අධිකරණයට ඉදිරිපත්ව ඇති සමස්ත ළමා අපචාර හා අපයෝජන නඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම නඩු අතුරින් මේ වන විට විභාග වෙමින් පවතින සංඛ්‍යාව සහ විභාග කොට අවසන් කර ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2009 සිට මේ දක්වා විභාග කළ ළමා අපචාර හා අපයෝජන නඩුවලදී වරදකරුවන් වී දඬුවම් ලැබූ සංඛ්‍යාව කොපමණද;

(ii) ළමා අපචාර හා අපයෝජන සිද්ධි සම්බන්ධයෙන් වරදකරුවන් වූවන්ට ලබා දෙන උපරිම දඬුවම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3013/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හ/තංගල්ල පිරිමි ජාතික පාසලේ ඉගෙනුම ලබන ශිෂ්‍යයෙකු 2007 අප්‍රේල් මස 4 වැනි දින තංගල්ල බස් නැවතුම්පොළේ සිට ඔහුගේ නිවසට රැගෙන යන අතරමගදී තංගල්ල එවකට හිටපු නගරාධිපතිවරයා විසින් බලවත් ලෙස අපයෝජනයට ලක්කර ඇති බවත්;

(ii) ඒ පිළිබඳව තංගල්ල පිරිමි ජාතික පාසලේ ශිෂ්‍ය උපදේශක ගුරු මහතාට දැන්වීමෙන් පසු තංගල්ල පොලිසියට පැමිණිලි කර ඇති බවත්;

(iii) එම පැමිණිල්ල ඉහත පොලිස් ස්ථානයේ පැමිණිලි අංක C.W.I.B 127 පිටුව 24 වන ඡේදයෙහි සටහන් කර ඇති බවත්;

(iv) එම පැමිණිල්ල අනුව එම නගරාධිපතිවරයාට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන මෙන් තංගල්ල නගරයේ විශ්‍රාමික පුරවැසි සංගමය ඉල්ලා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත පැමිණිල්ල පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3112/'12

ගරු රවී කරුණානායක මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) දේශපාලනඥයින් සහ දේශපාලනයට සම්බන්ධ නිලධාරීන් විසින් මුලතිව් දිස්ත්‍රික්කයේ සමහර ඉඩම් 2010 ජනවාරි මස සිට බලහත්කාරයෙන් අල්ලාගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) බලපත්‍ර හෝ ස්වර්ණභූමි ඔප්පු මත අයිතිය පවරනු ලැබූ, බදු දුන් හෝ අන්සතු කළ මුලතිව් දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම්වල නම්, අක්කර ප්‍රමාණය සහ වටිනාකම කොපමණද;

(ii) ඉහත ඉඩම් පැවරීමට හෝ ලබාදීමට හේතු සහ එහිදී ටෙන්ඩර් පටිපාටිය අනුගමනය නොකිරීමට හේතු කවරේද;

(iii) ඉහත (අ) හි සඳහන් ප්‍රදේශවල දශක ගණනාවක් තිස්සේ ජීවත්වන පුද්ගලයන්ට සහ අන් අයටත් ඉහත ආකාරයට ඉඩම් ලබා ගැනීමට අවස්ථාව සහ පහසුකම් ලබා දී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ත්‍රස්තවාදීන්ට අයත්ව තිබූ ප්‍රදේශ ශුද්ධකරණය කිරීමේ මුවාවෙන් මුලතිව් දිස්ත්‍රික්කයේ වෙරළාශ්‍රිත ඉඩම් ඒවායේ නීත්‍යානුකූල හිමිකරුවන්ගෙන් බලහත්කාරයෙන් හෝ තර්ජනය කිරීමෙන් අත්පත් කර ගැනීම පිළිබඳව චෝදනාව කරුණු සහගතද;

(ii) නොඑසේ නම්, එවන් චෝදනා එල්ල වන්නේ කෙසේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3926/'13

ගරු සුජීව සේනසිංහ මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2005 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාල සීමාව තුළ,

(i) ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති මුළු ඇඟලුම් කර්මාන්තශාලා සංඛ්‍යාව;

(ii) වැසී ගොස් ඇති එම කර්මාන්ත ශාලා සංඛ්‍යාව;

(iii) ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ පැවති මුළු රැකියා සංඛ්‍යාව;

(iv) ඇඟලුම් අපනයනය කිරීමෙන් ලැබූ විදේශ විනිමය ප්‍රමාණයේ වටිනාකම;

(v) ඇමෙරිකා එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා ඇඟලුම් අපනයන වෙළඳපොළ ප්‍රතිශතය;

(vi) යුරෝපා සංගමය තුළ එම වෙළඳපොළ ප්‍රතිශතය;

කොපමණද යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3943/'13

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාල සීමාව තුළ පත්කොට ඇති ජනාධිපති කොමිෂන් සභා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කොමිෂන් සභා කවරේද;

(iii) එම එක් එක් කොමිෂන් සභාව සඳහා වැය කර ඇති මුදල් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත එක් එක් කොමිෂන් සභාව,

(i) සැදුම්ලත් සාමාජිකයින් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ සුදුසුකම් කවරේද;

(ii) පත් කිරීමේ අරමුණු කවරේද;

(iii) තම වාර්තා ඉදිරිපත් කර තිබේද;

(iv) එම වාර්තා සභාගත කරන්නේද;

(v) එම වාර්තා මගින් ලබා දී ඇති නිර්දේශයන් ක්‍රියාත්මක කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3964/'13

ගරු පී. හැරිසන් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල පැවති යුද්ධය හේතුවෙන්,

(i) අනාථ වී ඇති ළමුන් සංඛ්‍යාව කොපමණද;

(ii) පුනරුත්ථාපනය කිරීම සඳහා ආරම්භකර ඇති වැඩසටහන් කවරේද;

(iii) වැන්දඹුභාවයට පත්වී ඇති කාන්තාවන්ගේ සහ අනාථභාවයට පත්වී ඇති දරුවන්ගේ පුරුත්ථාපන කටයුතු සඳහා 2013 අයවැයෙන් වෙන් කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4172/'13

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට ගම්පහ දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඩිපෝ සහ වෙනත් භූමි තුළ දින 30 කට වැඩි කාලයක් ධාවනයේ නොයොදවා නවතා තබා ඇති බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බස් රථ ධාවනය නොකර නවතා තබා ගැනීමට හේතු කවරේද;

(iii) එම බස් රථ නැවත ධාවනය කරවීම සඳහා අලුත්වැඩියාකිරීමට සිදුවේ නම්, ඒ සඳහා අවශ්‍ය වන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සුනාමි ව්‍යසනයෙන් පසුව ආධාර වශයෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට ලැබුණු බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වන විට එම බස් රථ අතුරින් ධාවන තත්ත්වයේ පවතින බස් රථ සංඛ්‍යාව කොපමණද;

(iii) 2012 ජනවාරි සිට මේ දක්වා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා ආනයනය කර ඇති බස් රථ සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 18 වැනි බදාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2445/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් නිල්වලා ගඟේ බණ්ඩත්තර ප්‍රදේශයේ දී ලවණ බාධක වේල්ලක් ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කර තිබේද;

(ii) එම වේල්ල ඉදිකිරීමෙන් අත්කර ගැනීමට අපේක්ෂිත අරමුණු කවරේද;

(iii) එවැනි වේල්ලක් ඉදිකරන්නේ නම්, ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iv) එම ප්‍රතිපාදන සපයාගන්නේ දේශීය මූලාශ්‍රවලින්ද; නැතහොත්, විදේශීය මූලාශ්‍රවලින්ද;

(v) ඉහත සඳහන් වේල්ල ඉදිකිරීම සඳහා මුදල් සපයනු ලබන ආයතනය හෝ ආයතන සහ එක් එක් ආයතනය ලබා දෙන මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) බණ්ඩත්තර ප්‍රදේශයේ ලවණ බාධක වේල්ලක් ඉදිකිරීම නිසා විශාල ගොවි බිම් ප්‍රමාණයක වගා හානිවන බවට ප්‍රදේශයේ ගොවීන් චෝදනා කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2467/'12

ගරු රවී කරුණානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සහනාධාර පදනම මත පොහොර ලබා දෙන්නේ කවුරුන් හටද;

(ii) සහනාධාර පදනම මත එක් ගොවියෙකුට ලබා දෙන පොහොර ප්‍රමාණය කොපමණද;

(iii) සහනාධාර මත ලබාදෙන පොහොර ලබාගැනීම සඳහා ඉල්ලුම් කිරීමට ගොවියෙකු අනුගමනය කළ යුතු ක්‍රියාදාමය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පොහොර සහනාධාරය ලබාදීම පිණිස 2010, 2011 සහ 2012 වර්ෂයන් තුළ සත්‍ය වශයෙන් වැයකළ මුදල් ප්‍රමාණයන් දිස්ත්‍රික් පදනමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සහනාධාරය සඳහා සත්‍ය වශයෙන් ගෙවීම් සිදුකිරීම සඳහා අවශ්‍යවන මුදල් ප්‍රවාහය කවරේද;

(iii) ඉහත කී වර්ෂයන්හි අයවැය ලේඛනවලින් පොහොර සහනාධාරය සඳහා වෙන් කිරීමට යෝජනා කරන ලද මුදල් ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2504/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටා තිබෙන ජනකපුර විද්‍යාලයේ භෞතික සම්පත් සහ මානව සම්පත්වල ඌනතාවයන් රැසක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ජනකපුර විද්‍යාලයේ පවතින භෞතික සම්පත් හා මානව සම්පත් ඌනතාවයන් කවරේද;

(ii) එම අඩුපාඩුකම් සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2013 දෙසැම්බර් මස 19 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2446/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර-කොළඹ අධිවේගී මාර්ගයේ නූපෙ සිට මාතර/ගොඩගම දක්වා මාර්ගය පුළුල් කිරීමේදී ඉඩම් පවරා ගැනීම හේතුවෙන් ඇතැම් ඉඩම් හිමියන්ගේ ඉඩම් කොටස් පර්චස් හයකට වඩා අඩුවී ඇති බවත්;

(ii) එවැනි ඉඩම්වල ඉදිකිරීම් කටයුතු සඳහා මාතර නගර සභාව අවසර නොදෙන බවත්;

(iii) එසේ වුවද, මාතර බෝධිය අසල සිට නූපේ දක්වා ධර්මපාල මාවත පුළුල් කිරීමේදී ඉතිරි වූ ඉඩම්වල පර්චස් හයක අවම සීමාව නොසළකා මාර්ග සංවර්ධන අධිකාරිය මගින් සීමා ලකුණු කළ ස්ථානයේ සිට ගොඩනැගිලි ඉදිකිරීමට එම නගර සභාව විසින් අවසර ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එකම නගර සභා බලප්‍රදේශයක් තුළ ඉහත පරිදි ක්‍රමවේදයන් දෙකක් ක්‍රියාත්මක කිරීම නිසා එක් ප්‍රදේශයක ජනතාවට විශාල අසාධාරණයක් සිදුවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ඉහත අ(iii) හි සඳහන් ලිහිල් කොන්දේසි යටතේම නූපේ - ගොඩගම මාර්ගය දෙපස කුඩා ඉඩම්වලද ඉදිකිරීම් සඳහා අවසර ලබාදීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2469/'12

ගරු රවී කරුණානායක මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ දක්වා පවත්වා ඇති "දැයට කිරුළ" ප්‍රදර්ශණ සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ප්‍රදර්ශණය පැවැත්වූ ස්ථානය කවරේද;

(iii) එම එක් එක් ප්‍රදර්ශණය සඳහා වැයකළ මුදල කවරේද;

(iv) අනාගතයේදී පැවැත්වීමට සැලසුම්කර ඇති දැයට කිරුළ ප්‍රදර්ශණ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැවති "දැයට කිරුළ" ප්‍රදර්ශණය පැවැත්වූ දිනය කවරේද;

(ii) එය පැවැත්වූ ස්ථානය සහ එකී ප්‍රදර්ශණ භූමිය සඳහා පවරාගත් ඉඩම් ප්‍රමාණය කවරේද;

(iii) එම ප්‍රදර්ශනය සඳහා වූ සමස්ත පිරිවැය සහ එක් එක් අමාත්‍යාංශය වෙනුවෙන් වැයකළ මුදල කොපමණද;

(iv) ඒ සඳහා ගනු ලැබූ ප්‍රාග්ධන භාණ්ඩ සඳහා වැයකළ මුදල සමස්ත වියදමේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(v) එම භූමියේ දැනට ඉතිරිව ඇති ප්‍රාග්ධන භාණ්ඩ හෝ ගොඩනැගිලි කවරේද;

(vi) එම ප්‍රදර්ශනය සඳහා ගනු ලැබූ ඉහත සඳහන් ප්‍රාග්ධන භාණ්ඩ සඳහා වැයකළ වියදම සාධාරණීකරණය කළ හැකිවන්නේ කෙසේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2505/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පිහිටා තිබෙන සම්පත්නුවර විද්‍යාලයේ භෞතික සම්පත් සහ මානව සම්පත්වල ඌනතාවයන් රැසක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) සම්පත්නුවර විද්‍යාලයේ පවතින භෞතික සම්පත් හා මානව සම්පත් ඌනතාවයන් කවරේද;

(ii) එම අඩු පාඩුකම් සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 20 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1965/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ගාල්ල දිස්ත්‍රික්කයේ, නාගොඩ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහිටි, මලාමුර ඇළ හරහා පාලමක් ඉදිකිරීම සඳහා මුල්ගල් තබා වර්ෂ කිහිපයක් ගතවී ඇතත්, මෙතෙක් එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලමේ ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දැමීමට හේතු කවරේද;

(ii) ප්‍රදේශයේ ජනතාවගේ ගමන් පහසුව සඳහා මෙම පාලම කඩිනමින් ඉදිකිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මලාමුර ඇළ හරහා පාලම ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(ii) එසේ නම්, වෙන්කර ඇති මුදල කොපමණද;

(iii) මුදල් වෙන්කර තිබේ නම්, එම පාලමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2471/'12

ගරු රවී කරුණානායක මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුරයේ පැවති "දැයට කිරුළ" ප්‍රදර්ශනයට සමගාමීව අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටුවන ලද කෘෂි ප්‍රවර්ධන ගොවිපළවල් සඳහා වැයකළ මුදල කොපමණද;

(ii) එකී ගොවිපළවලින් ලත් ප්‍රතිලාභ කවරේද;

(iii) "දැයට කිරුළ" ප්‍රදර්ශනය පැවැත්වීමට පෙර ඔයාමඩුව සත්ව ගොවිපළට අයත්ව සිටි එළදෙනුන් පන්සිය දැන් රඳවා සිටින ස්ථානය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) "දැයට කිරුළ" ප්‍රදර්ශනයට සමගාමීව ස්ථාපනය කළ ස්ථිර ජලසම්පාදන යෝජනා ක්‍රමය සඳහා වැයකළ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) "දැයට කිරුළ" ප්‍රදර්ශනය අවසන්වීමෙන් පසු එම ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලැබූ පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඔයාමඩුව සිට මානිස්සාගමුව හරහා තන්තිරිමලේ දක්වා දුම්රිය ධාවනය සඳහා දැරීමට සිදුවූ වියදම කොපමණද;

(ii) "දැයට කිරුළ" ප්‍රදර්ශනය පැවති දින නවය තුළ, එම දුම්රියෙන් ඉපැයූ ආදායම සහ ලැබූ ප්‍රතිලාභ කවරේද;

(iii) එකී දුම්රිය ධාවනය කිරීම සඳහා කරන ලද ඉදිකිරීම් ගලවා ඉවත්කිරීම සඳහා දැරීමට සිදුවූ වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2506/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පිහිටා තිබෙන කිරිඉබ්බන්වැව විද්‍යාලයේ භෞතික සම්පත් සහ මානව සම්පත්වල ඌනතාවයන් රැසක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කිරිඉබ්බන්වැව විද්‍යාලයේ පවතින භෞතික සම්පත් හා මානව සම්පත් ඌනතාවයන් කවරේද;

(ii) එම අඩුපාඩුකම් සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?